මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

மஹபொல உயர்கல்வி புலமைப்பரிசில் நம்பிக்கை நிதியம்

Mahapola Higher Education Scholarship Trust Fund

2020

වාර්ෂික වාර්තාව හා ගිණුම්

வருடாந்த அறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

2020

වාර්ෂික වාර්තාව හා ගිණුම්

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව

භාර අරමුදල

පටුන

අරමුදල් අරමුණු හා පරමාර්ථ	1
මූලික වටිනාකම්	2
පසුගිය දසක 04 හි සමාලෝචනය	3
පසුගිය වර්ෂ 05 තුළ ලබාගත් ජයග්‍රහණ	4
1981 සිය 2020 දක්වා උසස් අෂ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා	5
භාරකාර මණ්ඩලය - 2020	6
අධ්‍යක්ෂවරයාගේ වාර්තාව	7 - 9
මෙහෙයුම් සමාලෝචනය	10 - 16
ආයතනික යහපාලනය	17 - 19
මහපොළ භාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන	20 - 23
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල මගින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ව්‍යාපෘති	24 - 25
මූල්‍ය ප්‍රකාශන සඳහා විගණකාධිපති වාර්තාව	26 - 33
විගණන පිළිතුරු	33/1 - 33/16
මූල්‍ය ප්‍රකාශන	34 - 61

දැක්ම (Vision)

දිළිඳුකම තුරන් කිරීම ඉලක්ක කරගත් වියත් සමාජයක් බිහිකිරීම.

ඉලක්ක (Mission)

වරප්‍රසාද නොලත් යෞවනයනට උසස් අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනැමීම සහ උසස් අධ්‍යාපනය වෙනුවෙන් පහසුකම් නංවාලීම මඟින් සම අවස්ථා ඇති කිරීම.

මෙහෙවර (Objectives)

- යෞවනයන්ට උසස් අධ්‍යාපන පහසුකම් සැලසීම.
- ද්විතියන අධ්‍යාපනය සතුටුදායක ලෙස සම්පූර්ණ කර සිටින ආධාර ලැබීමට සුදුසු යෞවනයන්ට උසස් අධ්‍යාපන ආයතනයකදී සිය අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික
  අධ්‍යාපන කටයුතු සපුරා ගැනීම සඳහා උපකාර වන ආධාර සැපයීම.
- තරුණයින්ගේ හැකියා දියුණු කිරීම සඳහා වෘත්තීය අභ්‍යාස ආයතන පිහිටුවීම හා ඒවායෙහි කළමනාකරණයට සහායවීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පාසල් සහ ආයතන ආදිය පිහිටුවීම හා ඒවාට ආධාර සැලසීම.
- අධ්‍යාපන කටයුතු වැඩිදියුණු කිරීමෙහි නිරතවන පුද්ගලයින්ගේ නිපුණතා නංවාලීම සහ වර්ධනය කිරීම සඳහා ආධාර සැපයීම. (දැනට ප්‍රධාන වශයෙන් උසස් අධ්‍යාපනය සඳහා ශිෂ්‍යත්ව ලබාදීම මූලික හා ප්‍රමුඛ කාර්යය ලෙස සලකා ක්‍රියා කර ඇත.)

මූලික වටිනාකම්

සුපිලිපන්බව (Integrity)

අප විසින් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ සඳහා තෝරා ගන්නා ලද සිසුන් නියමිත ක්‍රමවේදයක් යටතේ ඉතා විනිවිද භාවයකින් යුක්තව සාධාරණව සිදු කරන අතර සුදුසුකම් ලබන සිසුන්ගේ ගෙවීම් ඉතා සාධාරණ කාලයක් තුළ ඔවුන්ට ලබාදීමට නිතරම උත්සුක වේ.

නම්‍යතාවය (Flexibility)

අරමුදලේ සේවයකයින් හා අධ්‍යක්ෂ අතුලු භාරකාර මණ්ඩලය අරමුදල ශක්තිමත් කිරීම සඳහා නව අදහස් සොයා යමින් තරහකාරී මූල්‍ය වෙළඳපළ තුල ඉතා සාර්ථකව කටයුතු කරයි.

සුභවාදී ආකල්ප (Positive Attitudes)

ශිෂ්‍යාඥ ලබාදීමේදී හා අනෙකුත් ආයතන සමඟ හා විශ්ව විද්‍යාල සමඟ කටයුතු කිරීමේදී හා අරමුදල් සපයා ගැනීමේදී ඉතා විශාල අභියෝග රාශියකට මුහුණදීමට සිදුවන අතර එම සියලුම අභියෝග ඉතා සුභවාදීව ජය ගැනීමට මනා එළඹුමක් සේවකයන් තුළ පවතී.

කණ්ඩායම් හැඟීම (Team Spirit)

මහපොළ ශිෂ්‍යාඥ අරමුදලේ සේවකයින් විවෘතභාවය, එකිනෙකා කෙරෙහි දක්වන ලෙන්ගතු බව සහ පුද්ගල සංවර්ධනය ඔස්සේ ආයතනික ඉලක්ක සපුරා ගැනීමෙහිලා එක්ව කටයුතු කරති.

ප්‍රතිඵලදායක බව (Effectiveness)

ස්වකීය කාර්යභාරයන් පිළිබඳව මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදලේ සේවකයින් තුළ මනා අවබෝධයක් හා විශ්වාසනීයත්වයක් පවතින අතර ඔවුන් දෙන ලද ඉලක්ක කාර්යක්ෂමව අත්පත් කර ගැනීමට නිතරම උක්සුක වේ. ඉතා කුඩා සේවක සංඛ්‍යාවක් (සේවකයන් 10 ක්) තුළින් මාසිකව ශිෂ්‍යාඥ 70,000 ක් පමණ ගෙවීම් සිදු කරනු ලබයි.

විශිෂ්ඨත්වය කෙරෙහි නැඹුරුව (Tendency towards uniqueness)

මහපොළ ශිෂ්‍යාඥ අරමුදලේ සේවකයින් අඛණ්ඩව සේවා තත්වයන් උපරිම මට්ටම් කරා රැගෙන ඒම සඳහා කැපවීමෙන් ක්‍රියා කරති.

පසුගිය දසක 04 හි සමාලෝචනය

දිවංගත ගරු ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් 1980 වසරේ දී එවකට වෙළඳ හා නාවික ඇමතිවරයා ලෙස ‘‘මහපොළ’’ සංකල්පය යටතේ පළමුවෙන්ම වෙළඳ සල්පිලක් මගින් ග්‍රාමීය ප්‍රජාව වෙත විවෘත ආර්ථිකයේ ප්‍රතිලාභ හා දැනුම අත්පත් කරදීමේ අභිප්‍රාය ඇතිව එවකට පැවති වෙළඳ හා නාවික කටයුතු අමාත්‍යාංශය යටතේ මහපොළ වෙළඳ ප්‍රදර්ශනය හා සල්පිළ ආරම්භ කරන ලදි. පාසැල් තුල පැවැත් වූ වෙළඳ සල්පිල් හා අධ්‍යාපනික ප්‍රදර්ශන වලදී දොරටු ප්‍රවේශ පත්‍ර හා අලෙවි කුටි අලෙවිය සහ මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ ලොතරැයිය මගින් ලද ආදායම සහ පරිත්‍යාග එම පාසැල් වල යටිතල පහසුකම් නැංවීම පිණිස සහ මහපොළ ශිෂ්‍යත්ව පිරිනැමීම සඳහා ආරම්භයේදී යොදා ගන්නා ලදි. වාණිජ ආර්ථිකයේ මුලිකම වෙනස නාගරික ජනතාවට තරම් ඉක්මනින් ගම්බද ජනතාවට ලැබුනේ නැත. නව වෙළඳ ක්‍රමය තුලින් නාගරික ජනතාව විදි බොහෝ වරප්‍රසාද ගම්බද ජනතාවට නොලැබුණි. මෙම ගම්බද, නගරබද පරතරය නැති කොට ගම්බද ජනතාවට දැනුම හා අත්දැකීම් ලබාදීමේ අරමුණින් එවකට සිටි ගරු වෙළඳ හා නාවික ඇමති ලලිත් ඇතුලත්මුදලි මැතිතුමා විසින් තබන ලද එක් පියවරකි ‘‘මහපොළ‘‘ අද පොදු ජනතාවගේ දායාදයකි. උසස් අධ්‍යාපනයක් ලැබීමේ සහජ හැකියාව ඇති, නමුත් ආර්ථික ප්‍රශ්න වලට මුහුනපා සිටින ජාතියේ උතුම්ම දායාදය වන අනාගත පරපුරට අතදිමකි.

1981 නොවැම්බර් 14 දින ප්‍රථම ශිෂ්‍යාඥ ප්‍රදානෝත්සවය ශිෂ්‍යාඥ 422 පිරිනමමින් බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රන ශාලාවේදි පැවැත්විනි. ආරම්භයේ සිට 2020 වන විට ශිෂ්‍යාඥ 315,000 කට අධික ප්‍රමාණයක් පිරිනමා ඇති අතර ඒ සඳහා රු.බි 17 පමණ වැය කොට ඇත. අද වන විට මෙම කර්තව්‍ය සඳහා රුපියල් මිලියන 2,000 ක පමණ මුදලක් වාර්ෂිකව විශ්වවද්‍යාල සිසුන් හා කාර්මික විද්‍යාල සිසුන්ගේ ශිෂ්‍යත්ව වාරික ගෙවීම් සඳහා වැයකරනු ලැබේ.

විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමට නොහැකි වූ සිසුන්ට තොරතුරු තාක්ෂණ අධ්‍යාපනය සඳහා, 1999 වර්ෂයේදි කඩුවෙළ මාලඹේ ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) තොරතුරු තාක්ෂණ අධ්‍යයන කටයුතු සඳහා ආරම්භ කරන ලදි. ඒ සඳහා මහපොළ අරමුදලින් රුපියල් මිලියන 373ක මුදල්ද, අක්කර 25ක ඉඩමද ලබාදී ඇත. එම ආයතනය තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමා සහ උපාධි පාඨමාලා පවත්වනු ලැබේ. දැනට වාර්ෂිකව සිසුන් 10,000ක් පමණ බඳවා ගනු ලැබේ.

වර්තමාන ආර්ථිකයේ ඇති අවපාතයන් හා වේගවත් විවලනයන් හමුවේ මහපොළ යටතේ පිහිටවූ උප සමාගම් වන NWSL/NWCL සමාගම් පවත්වාගෙන යාම මහපොළ අරමුදලට වාසිදායක නොවන බව හඳුනාගෙන එම සමාගම් පසුගිය වර්ෂවල ලද අලාභයන්ද සැලකිල්ලට ගෙන 2020 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩල අනුමැතිය යටතේ උක්ත සමාගම් වසා දැමීමට තීරණය කරන ලදී.

ඉහත සියළුම අභියෝග හමුවේ 2020 වර්ෂය අවසන් වන විට මහපොළ භාර අරමුදල සතු සමස්ත අරමුදල රු.බි. 11.5ක් වූ අතර වාර්ෂික ආදායම රු.බි. 1.2ක් විය. සංවර්ධන ලොතරැයි ලාභද සමග සමස්ථ වාර්ෂික ආදායම රු.බි. 2.6ක්වූ අතර දැනට ලබාදෙන ශිෂ්‍යත්ව සඳහා රු.බි. 1.6ක් වැය වූ අතර 2020 ශුද්ධ අතිරික්තය රු.බි. 1 ක් විය.

පසුගිය වර්ෂ 05 තුළ (2015-2020) ලබාගත් ජයග්‍රහණ

- 2015 වර්ෂයේ ශිෂ්‍යාර්ථ වාරිකයක වටිනාකම රු.2,150/- සිට රු.2,550/- දක්වා වැඩි කිරීම. (භාණ්ඩාගාර දායකත්වය රු.350/- සිට රු.2,450/- දක්වා වැඩි කරන ලදී.)

- 2018 වර්ෂයේ දී මහපොළ ශිෂ්‍යාර්ථ සඳහා සුදුසුකම් ලැබීමේ ආදායම් සීමාව රු.ලක්ෂ 03 සිට රු.ලක්ෂ 05 දක්වා වැඩි කල අතර ඒ තුළින් අතිරේක ශිෂ්‍යාර්ථ 3,000 ක් පමණ වැඩි විය.

- 2019 වර්ෂයේ දී ශිෂ්‍යාර්ථ ගෙවීම් සඳහා සෘජු බැංකු ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව දැනට පවතින Covid – 19 වසංගත තත්ත්වය හමුවේ සිසුන් මාර්ග ගත ක්‍රමයට දේශන සඳහා සහභාගී වන අතර සෘජු ගෙවීම් ක්‍රමය යටතේ සිසුන්ගේ ගිණුම්වලට මාසික ශිෂ්‍යාර්ථ වාරිකය සෘජුවම බැර කරනු ලැබේ.

- සියලුම උසස් තාක්ෂණ ආයතනවල සිසුන් සඳහා ශිෂ්‍යාර්ථ වාරික මුදල රු.1,000/- කින් ඉහළ නැංවීමට 2019 වර්ෂයේ දී හැකියාව ලැබුණි.

- 2020 වර්ෂයේ අභියෝග හමුවේ වුවද වාර්ෂිකව ලබාදෙන ශිෂ්‍යාර්ථ සංඛ්‍යාව 1,000 කින් ඉහළ නැංවීමට හැකියාව ලැබුණි. ඒ අනුව 2020/2021 අධ්‍යයන වර්ෂයේ සිසුන් 16,000 කට ශිෂ්‍යාර්ථ පිරිනැමීමට කටයුතු යොදා ඇත.

- 2020 වර්ෂයේ මුල්‍ය වෙළෙඳපලේ අස්ථායි තත්ත්වය යටතේ වුවද ක්‍රමවත් මූල්‍ය කළමනාකරණය තුළින් හා වියදම් පාලනය කිරීම තුළින් 6% ක ශුද්ධ වාර්ෂික වර්ධනයක් ලභාකර ගැනීමට හැකිවිය.

- මහපොළ අරමුදලේ ප්‍රාග්ධන වත්කම් ඉහළ නංවමින් ඉදිරි 05 වසර තුළ දැනට ලබාදෙන ශිෂ්‍යාර්ථ සංඛ්‍යාව 50% කින් පමණ ඉහළ නැංවීම සිදුකල යුතු බැවිනුත් අරමුදලේ වාර්ෂික ආදායම රු.බි.02 කින් පමණ වැඩිකල යුතුව ඇත. ඒ සඳහා වර්තමාන විෂය භාර අමාත්‍යවරයා හා භාරකාර මණ්ඩලය මහපොළ අරමුදල යටතේ නව ව්‍යාපෘති 05 ක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2020 වර්ෂයේ දී සිදුකිරීමට හැකියාව ලැබුණි. ඒ තුළින් 2025 වර්ෂය වනවිට අරමුදලේ ප්‍රාග්ධන වත්කම් රු.බි.20 ක් දක්වා වර්ධනය කිරීම අපේක්ෂා කෙරේ.

1981 සිට 2020 දක්වා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල භාර අමාත්‍යාංශය හා විෂය භාර අමාත්‍යවරයා

	විෂය භාර අමාත්‍යාංශය	විෂය භාර අමාත්‍යවරයා	කාලය (වර්ෂය)
1	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා	1981 - 1983
2	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (ජාතික ආරක්ෂක අමාත්‍ය)	1984 - 1988
3	වෙළඳ හා නාවික අමාත්‍යාංශය	ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1989-1990
4	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සුර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1991 -1992
5	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සුර් අමාත්‍යතුමා - භාරකරු, ගරු ලලිත් ඇතුලත්මුදලි අමාත්‍යතුමා (කෘෂිකර්ම,ආහාර හා සමුපකාර අමාත්‍ය)	1993
6	වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු ඒ.ආර් මන්සුර් අමාත්‍යතුමා	1994
7	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය	ගරු කිංස්ලි ටී වික්‍රමරත්න අමාත්‍යතුමා	1995 - 2000
8	අභ්‍යන්තර හා අන්තර් ජාතික වෙළඳ හා වාණිජ, නාවික සංවර්ධන හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2001
9	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු රවි කරුණානායක අමාත්‍යතුමා	2002 - 2004
10	වාණිජ හා පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය	ගරු ජෙයරාජ් ප්‍රනාන්දුපුල්ලේ අමාත්‍යතුමා	2004 මැයි - 2007
11	වෙළඳ, අලෙවි සංවර්ධන සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශය	ගරු බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2008 - 2009
12	සමුපකාර හා අභ්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු අමාත්‍යතුමා	2010 - 2012
13	ජනාධිපති ලේකම් කාර්යාලය	ජනාධිපති ලේකම්	2013 - 2014
14	ආහාර සුරක්ෂිතා අමාත්‍යාංශය	ගරු ගාමිනී ජයවික්‍රම පෙරේරා අමාත්‍යතුමා	2015
15	සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය	ගරු මලික් සමරවික්‍රම අමාත්‍යතුමා	2015 නොවැ. - 2018
16	උසස් අධ්‍යාපන හා සංස්කාතික කටයුතු අමාත්‍යාංශය	ගරු ආචාර්ය විජයදාස රාජපක්ෂ අමාත්‍යතුමා	2018 ජූලි
17	නගර නිර්මාණ, ජල සම්පාදන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය	ගරු රාවුෆ් හකීම් අමාත්‍යතුමා	2018 ඔක් - 2019 නොවැ.
18	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2019 නොවැ.
19	වෙළෙඳ අමාත්‍යාංශය	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන අමාත්‍යතුමා	2020 ජනවාරි

භාරකාර මණ්ඩලය - 2020

	භාරකරු/භාරකරුවන්	නිලය	තනතුර
1.	ගරු ජයන්ත ජයසූරිය මහතා	අග්‍රවිනිශ්චයකාරතුමා	සභාපති
2.	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා	වෙළෙඳ අමාත්‍ය	ප්‍රාරම්භක භාරකරු
3.	ජේ.එම්.භද්‍රානි ජයවර්ධන මහත්මිය	ලේකම්, වෙළෙඳ අමාත්‍යාංශය	නිල භාරකරු
4.	මහාචාර්ය කපිල පෙරේරා මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	නිල භාරකරු
5.	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා	පත්කල භාරකරු	පත්කල භාරකරු
6.	ආචාර්ය රවින්ද්‍රනාත් ලියනගේ මහතා	පත්කල භාරකරු	පත්කල භාරකරු



මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඥ භාර අරමුදලේ අධ්‍යක්ෂවරයාගේ වාර්තාව

ආරම්භය

2020 වර්ෂය ඉතාමත් අභියෝගාත්මක වර්ෂයක් වූ අතර Covid – 19 වසංගත තත්ත්වය හමුවේ දෛනික කටයුතු අඩපන වූ අතර කාර්යාල වැඩ කල දින ගණනද සීමා විය. කෙසේ වෙතත් අරමුදලේ ආයෝජන කටයුතු අඛණ්ඩව සිදුකල අතර 6% ක පමණ වාර්ෂික ශුද්ධ ආදායමේ වර්ධනයක් ලබා ගැනීමට හැකිවිය. බහුතර සේවක සංඛ්‍යාවක් නිවසේ සිට රාජකාරී සිදුකරමින් අඛණ්ඩව සිසුන්ගේ ශිෂ්‍යාඥ වාරික ගෙවීමට හැකිවූ අතර 2020 දෙසැම්බර් වනවිට එම වර්ෂයට අදාල වාරික 9 ක් ගෙවා අවසන් කොට තිබුණි. වර්ෂයේ ආරම්භයේ සිටම බැංකු පොළී අනුපාතය ඉතා විශාල ලෙස පහළ ගිය අතර පසුගිය වර්ෂයට සාපේක්ෂව 50% ක පහළ යෑමක් වාර්තා විය. ඒ අනුව ස්ථාවර තැන්පතු සඳහා 2019 වර්ෂයේ 10% -11% අතර පැවති පොළී අනුපාතය 2020 මැද වනවිට 5.5% මට්ටමකට පහළ වැටුනි. නමුත් මහපොළ අරමුදල 60% පමණ ප්‍රතිශතයක් භාණ්ඩාගාර බැඳුම්කරවල හා බැංකු ස්ථාවර තැන්පතු වර්ෂයක් හෝ ඊට වැඩි කාලයක් සඳහා ආයෝජනය කර තිබීම මත යම්තාක් දුරට පොළී ආදායම පහළ යාමක් සිදු නොවිණි. කෙසේ වෙතත් 2020 වර්ෂය පුරාම මෙම පහළ පොළී අනුපාතය පැවතීම තුළ 2020 වර්ෂයේ සිදුකල සියලුම ආයෝජන 5.5% සිට ඉතා අඩු පොළී අනුපාතයක් යටතේ ආයෝජනය කරන ලදි. ඒ සියලුම ආයෝජන කමිටුව විසින් අනුමත කොට සිදුකල අතර මාස 03 හා මාස 06 වැනි කෙටි කාලීන තැන්පතුවල ආයෝජනය කරන ලදී. ඒ තුළින් පොළී අනුපාතය ඉහළ යෑමක් අපේක්ෂා කළ අතර 2020 වර්ෂය අවසන් වන තුරුම පහළ පොළී අනුපාත තත්ත්වය පැවතිනි. මෙය 2021 වර්ෂයේ ආදායම පහළ යෑමට බලපෑම් ඇති කරනු ඇත. එසේම මහපොළ අරමුදලේ ප්‍රධාන ආදායම් මාර්ගයක් වන සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයද වසංගත තත්ත්වය යටතේ පහළ යෑමක් සිදුවිය.

කෙසේ වෙතත් මහපොළ අරමුදලේ වර්තමාන භාරකාර මණ්ඩලය, ගරු විෂය භාර අමාත්‍යවරයා හා ආයෝජන කළමනාකරණ කමිටුවේ මඟ පෙන්වීම හා අධීක්ෂණය මත 2020 වර්ෂය අවසන් වනවිට රු.බි.1 ක පමණ අතිරික්තයක් සහිතව අරමුදල පවත්වාගෙන යෑමට හැකිවිය.

ඉදිරි දැක්ම

Covid – 19 වසංගත තත්ත්වය 2021 වර්ෂය තුළ ද පැවතිය හැකි බැවින් හා බැංකු පොළී අනුපාතය තවදුරටත් පහළ අගයක් ගන්නා බැවින් අරමුදලේ ආදායම් තත්ත්වය හා ප්‍රාග්ධන වත්කම් වැඩි කිරීම අපේක්ෂා කොටගෙන හා වාර්ෂිකව විශ්වවිද්‍යාලවලට බඳවා ගන්නා සිසුන් සංඛ්‍යාව ඉහළ නැවීම මත ඉදිරි වර්ෂ 05 තුළ ශිෂ්‍යාඥ සංඛ්‍යාව 30% කින් පමණ ඉහළ නැංවීමට අපේක්ෂාවෙන් වර්තමාන විෂය භාර අමාත්‍යවරයාගේ දැඩි කැපවීම හා මඟපෙන්වීම මත මහපොළ අරමුදල යටතේ ප්‍රධාන ව්‍යාපෘති 05 ක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු 2020 වර්ෂය තුළ ආරම්භ කල අතර එහි මූලික අධියර 2021 වර්ෂය අවසන් වීමට ප්‍රථම ආරම්භ කිරීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් මහපොළ අරමුදලට ඉදිරි වර්ෂ 05 ඇතුළත රු.බි.08 ක පමණ අතිරේක ප්‍රාග්ධන අරමුදලක් එකතු කිරීමට හා වාර්ෂික ආදායම රු.බි.02කින් පමණ ඉහළ දැමීමට අපේක්ෂා කෙරේ.

ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදල් පනත 1981 පාර්ලිමේන්තුවේ සම්මත කළ අතර, අද වන විට වසර 40 ක් ගෙවී ඇති නමුත් අරමුදලේ මූල්‍ය ක්‍රියාකාරීත්වය ආරක්ෂා කිරීමට හා අරමුදල පරිපාලනය සඳහා පත්කරන ලද නිලධාරීන් හා භාරකරුවන් අතින් සිදුවන වැරදි හා අවභාවිතයන් නිසා අරමුදලට සිදුවන අලාභ අවම කරගැනීම සඳහා භාර අරමුදලේ සියලුම සේවකයින් හා භාරකරුවන් පොදු දේපල පනතේ වැරදි සම්බන්ධ වන විධි විධාන වලට යටත් කිරීමට අදාල සංශෝධන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර භාර අරමුදල් පනතට ඇතුලත් කොට 2020 වසරේ දී මහපොළ පනත සංශෝධනය කරන ලදී.

2019 වර්ෂයේදි මහපොළ අරමුදල කළමනාකරණය කිරීම සඳහා විශේෂ අරමුල් කළමනාකරණ කමිටුවක් භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ ස්ථාපිත කල අතර අරමුදලේ සියලුම ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරිත්වය මෙම ස්ථාපිත ආයෝජන කමිටුවේ අනුමැතිය යටතේ ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබුණු අතර ඒ තුලින් ආයතනය ශක්තිමත් යහපාලනයක් ඇති කිරීමට හැකියාව ලැබුණි. 2020 වර්ෂයේදි සැම මාස 03කට වරක් ආයෝජන කමිටු රැස්වීම් පවත්වා ඇති අතර සියලුම ආයෝජන එම කමිටු නිර්දේශ මත සිදු කොට ඇත.

ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා නව තාක්ෂණය යොදා ගැනීම

2019 වර්ෂයේ සිට මාසික ශිෂ්‍යත්ව වාරික ගෙවීම් ක්‍රියාවලිය ප්‍රතිව්‍යුහගත කර ඇති අතර සෘජු බැංකු ගෙවීම් ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව සෑම මසකම 15 වන දින සිසුන්ගේ බැංකු ගිණුම වෙත අදාල මාසික වාරිකය බැර කරනු ලැබේ. ඒ අනුව විශ්වවිද්‍යාල සිසුන් 60,000 කට පමණ මෙම සෘජු බැංකු ගෙවීමේ ක්‍රමය යටතේ ශිෂ්‍යත්ව වාරික ගෙවනු ලබයි. මෙම ක්‍රමය සාර්ථකව ක්‍රියාත්මක කිරීම තුල 2020 වර්ෂය තුල පැවති COVID 19 වසංගත තත්වය හමුවේ සිසුන් මාර්ගගත ක්‍රමයට අධ්‍යාපනය හදාරන අතර ඔවුන්ගේ මාසික ශිෂ්‍යත්ව වාරික සෘජුවම බැංකු ගිණුම් වෙත බැර කරන ලදී.

වත්කම් සුරක්ෂිත කිරීම

මහපොළ අරමුදලේ මුදල් ආයෝජනය කොට ආරම්භ කල SLIIT ආයතනයේ සිදුවී ඇති වත්කම් අවභාවිතය පිළිබඳ ගිවිසුම් සාවද්‍ය බව තහවුරු කරමින් විගණකාධිපතිවරයා විසින් ඉදිරිපත් කරන ලද විශේෂ විගණන වාර්තාව අනුව COPE කමිටුව විසින් එම සාවද්‍ය ගිවිසුම් මඟින් මහපොළ අරමුදලේ වත්කම් අවභාවිතය කොට ඇති බව තහවුරු කරමින් COPE වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කොට ඇත. 2015 සිට 2018 දක්වා රජයේ ආයතනවල සිදුවී ඇති දූෂණ හා වංචා සොයා බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් පත්කල විශේෂ ජනාධිපති කොමිෂන් වාර්තාව ද SLIIT සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදුකොට එම වාර්තාව ද පාර්ලිමේන්තුවේ සභාගත කොට ඇත. මෙම වාර්තා මඟින් මහපොළ අරමුදලේ වත්කම් අවභාවිතා වී දූෂණයක් සිදුවී ඇති බව තහවුරු වීම තුළින් මහපොළ අරමුදලට අයත් වත්කම් නැවත ස්ථාපිත කිරීමට හැකිවීම මහපොළ අරමුදලේ වත්කම් ශක්තිමත් කිරීමට ගත් පියවරක් වශයෙන් දක්වමි. ඉතා කෙටි කාලයක් තුළ මෙම වත්කම් මහපොළ අරමුදලේ පාලනයට යටත් වන බව සතුටින් දන්වමි. මේ සඳහා කැපවීමෙන් කටයුතු කරන වර්තමාන වෙළෙඳ අමාත්‍ය හා මහපොළ විෂයභාර අමාත්‍යවරයාට හා ලේකම්තුමියට මාගේ කෘතඥ පූර්වක ස්තුතිය පුද කරමි.

අවසාන වශයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ශක්තිමත් කිරීමටත් එහි යහපාලනය හා ක්‍රියාකාරිත්වය තුලින් ස්ථාපිත අරමුණු සාක්ෂාත් කරගැනිමටත් සහයෝගය දැක්වූ ප්‍රාරම්භක භාරකරු නියෝජනය කරමින් පත් වූ සියලුම විෂය භාර අමාත්‍යවරුන් නිළ භාරකරුවන්, නිළධාරීන් හා ඉතා කැපවීමෙන් වැඩ කල සේවක මණ්ඩලයට, වෙළෙඳ අමාත්‍යාංශයේ හා අනිකුත් සියලුම උසස් අධ්‍යාපන ආයතන වල සියලුම නිළධාරීන්ටත් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපතිවරයා ඇතුලු කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පල කර සිටිමි.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට එළඹෙන 2021 වර්ෂය ඉතා අභියෝගාත්මක වර්ෂයක් බවත් එය කළමනාකරණය කර ගනිමින් උසස් අධ්‍යාපනය අපේක්ෂවෙන් සිටින අඩු පහසුකම් ඇති යෞවනයන්ගේ උසස් අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හා ශක්තිමත් කිරීමට පවතින අභියෝග ජය ගනිමින් අවශ්‍ය මූල්‍යමය ශක්තිය ලබා දීමට හැකි වන ඉතා විශිෂ්ට ආයතනයක් බවට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල පත්වේවා යැයි මම එක සිතින් ප්‍රාර්ථනා කරමි.

පරාක්‍රම බණ්ඩාර,
අධ්‍යක්ෂ,
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල.

ශිෂ්‍යත්ව ගෙවීම්

ශිෂ්‍යත්ව ගෙවීම් පිළිබඳ තොරතුරු (වාරිකයකට ගෙවනු ලබන මුදල)

ශිෂ්‍යත්ව වර්ගය	ශිෂ්‍යත්වයක් සඳහා ගෙවනු ලබන මුදල (රු.)	මහපොළ භාරකාර අරමුදලේ දායකත්වය (රු.)	භාණ්ඩාගාරයේ දායකත්වය (රු.)
සාමාන්‍ය ශිෂ්‍යත්ව ගෙවීම්	5,000/-	2,550/-	2,450/-
කුසලතා පදනම මත ශිෂ්‍යත්ව ගෙවීම්	5,050/-	2,600/-	2,450/-

ශිෂ්‍යත්ව ප්‍රදාන

සිසුන් ඇතුළත් කරගැනීම	ශිෂ්‍ය සංඛ්‍යාව
විශ්වවිද්‍යාල සිසුන්	65,000
තාක්ෂණ විද්‍යාල සිසුන්	6,000

ශිෂ්‍යත්ව ගෙවීම සඳහා වාර්ෂික පිරිවැය	**රු.බි.1.8**

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානය **2020 (2018/2019** අධ්‍යයන වර්ෂය)

	විශ්වවිද්‍යාලය	**2020 (2018/2019)**
1.	කොළඹ	1,815
2.	පේරාදෙණිය	1,852
3.	කැළණිය	2,001
4.	ශ්‍රී ජයවර්ධනපුර	2,372
5.	මොරටුව	952
6.	යාපනය	996
7.	යාපනය - වවුනියා මණ්ඩපය	104
8.	රුහුණ	1,043
9.	නැගෙනහිර	391
10.	ගම්පහ වික්‍රමාරච්චි අයුර්වේද විද්‍යායතනය	29
11.	දේශීය වෛද්‍ය විද්‍යායතනය	116
12.	කොළඹ පරිගණක පාසැල	125
13.	කොළඹ - ශ්‍රී පාලි	40
14.	සෞන්දර්ය කලා	216
15.	අග්නිදිග	598
16.	රජරට	812
17.	සබරගමුව	477
18.	වයඹ	654
19.	නැගෙනහිර-ත්‍රිකුණාමලය මණ්ඩපය	129
20.	ඌව වෙල්ලස්ස	189
21.	ස්වාමි විපුලානන්ද විද්‍යායතනය	37
	මුළු ශිෂ්‍යත්ව සංඛ්‍යාව	**14,957**

මෙහෙයුම් සමාලෝචනය

මහපොළ ශිෂ්‍යත්ව ප්‍රදානයන් (අනෙකුත් ආයතන)

ආයතනය		සිසුන් සංඛ්‍යාව
1.	ශ්‍රී ලංකා නීති විද්‍යාලය	25
2.	ජාතික තාක්ෂණ ආයතනය, මොරටුව	170
3.	බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය	26
4.	බුද්ධ ශ්‍රාවක භික්ෂු විශ්වවිද්‍යාලය	20
5.	ජාතික සමාජ සංවර්ධන ආයතනය (උපාධි 10 ඩිප්ලෝමා 14)	10
6.	ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය	1,500
7.	ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය	400
	එකතුව	**2,151**

විශ්ව විද්‍යාල ප්‍රවේශිත මුළු ශිෂ්‍යකඳ සංඛ්‍යාව හා මහපොළ ශිෂ්‍යකඳලාභීන් අතර සැසඳීම

වර්ෂය	2017	2018	2019	2020
විශ්වවිද්‍යාලවලට ඇතුලත් වූ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව	30,000	31,158	34,161	35,000
ආදායම් සීමාව (රු.ලක්ෂ 5 ට අඩු) අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව	15,000	20,000	17,890	20,000
මහපොළ ශිෂ්‍යකඳලාභීන් සංඛ්‍යාව	14,500	14,984	15,001	15,000
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ ශිෂ්‍ය සංඛ්‍යාව මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	50%	64.1%	52%	57.1%
මහාපොළ ලාභීන් මුළු ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස	48%	48.%	44%	42.85%
ආදායම් සීමාව අනුව සුදුසුකම් ලැබූ සිසුන් අතරින් මහපොළ ලැබූ සිසුන්	96%	75%	84%	75%

2020.12.31 දිනට මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව අරමුදලේ මූල්‍ය තත්වය

සමස්ථ අරමුදල



	Rs. Bn
Main Fund	11.8
NWCL Invest.	1.0
SLIIT Invest.	1.0
DLB Invest.	0.2
Total	**14.0**

ආයෝජන කළඹ - ප්‍රධාන අරමුදල



	Rs. Mn
T/ Bonds	5,772
Debenture	1,458
FD	3,913
Total	**11,143**

ආයෝජන ආදායම - ප්‍රධාන අරමුදල



	Rs. Mn
TB Coupon	629.9
TB Cap. Gain	50.5
TB Int.	0.2
Debent. Int.	205.3
FD Int.	287.9
Other Income	9.2
Total	**1182.8**

සමස්ථ ආදායම **2020**



	Rs. Mn
Int. Income	
Main Fund	1255.4
DLB Profit	1262.6
SLIIT Rent	25.0
Total	**2543.0**

2020.12.31 දිනෙන් අවසන් කාලච්ඡේදය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශන සැසඳීම

	රු.මි. 000		
ආදායම	**31.12.2020**	**31.12.2019**	**විචලනය (%)**
පොළී ආදායම - භාණ්ඩාගාර බැඳුම්කර	579.5	621.4	
පොළී ආදායම - භාණ්ඩාගාර බිල්පත්	173.2	50.2	
පොළී ආදායම - වත්කම් පිටුබලය සහිත විශ්වාසය	0.2	6.3	
පොළී ආදායම - ස්ථාවර තැන්පතු	-	32.4	
පොළී ආදායම - ණයකර	287.9	253.3	
පොළී ආදායම - කෙටිකාලීන තැන්පතු	205.3	171.6	
භාණ්ඩාගාර බැඳුම්කර මත ප්‍රාග්ධන ලාභ	9.2	15.1	
මුළු ආයෝජන ආදායම	**1,255.3**	**1,150.3**	**9%**
ඍජු වියදම්			
භාරකාර ගාස්තු - ලංකා බැංකු ව (MTF)	(3.5)	(1.7)	
මූල්‍ය වියදම් - භාණ්ඩාගාර බැඳුම්කර අධිමිල	-	-	
ලංකා බැංකු ණය පොළී වියදම	-	(36.7)	
ශුද්ධ ආයෝජන ආදායම	**1,251.8**	**1,111.63**	**13%**
වෙනත් ආදායම්			
DLB ලාභ කොටස	1262.6	997.3	
SLIIT බදු කුලිය	25.0	20.0	
මුළු වෙනත් ආදායම්	**1,287.6**	**1,017.3**	**(26%)**
මුළු ආදායම	**2,539.4**	**2,125.9**	
වියදම්			
ශිෂ්‍යත්ව ගෙවීම්	(1,391.4)	(1,311.7)	**(6%)**
වේතන	(15.9)	(15.2)	
වෙනත් පරිපාලන වියදම්	(16.1)	(16.2)	
ක්ෂය	(30.8)	(29.9)	
මුළු වියදම්	**(454.2)**	**(1,373.0)**	
වියදම් ඉක්මවූ ශුද්ධ ආදායම	**1,085.3**	**755.09**	**44%**
බදු පෙර ශුද්ධ ලාභය / අලාභය			
ආදායම් බදු ප්‍රතිපාදන	-	-	
මුළු බදු පසු ආදායම	**1,085.3**	**755.09**	**44%**

2020 අයවැය සමාලෝචනය

විස්තරය	අයවැය 2020 (රු.මි)	සත්‍ය වැය 2020.12.31 (රු.මි)	විචලනය	
			(රු.මි)	%
ආදායම				
ප්‍රධාන අරමුදලේ පොලී ආදායම	1,200	1,255	55	4.58
සංවර්ධන ලොතරැයි ලාභ	1,000	1,262	262	26.20
SLIIT බදු කුලී	20	25	5	25
මුළු ආදායම	**2,220**	**2,542**	**322**	**14.50**
වියදම්				
පුනරාවර්තන	**1,721.4**	**1,429.7**	**291.5**	**16.74**
ශිෂ්‍යත්ව ගෙවීම්	1,687.7	1,389.5	298.2	
සේවක වේතන	19.6	17.2	2.4	
නඩත්තු	2.0	2.2	(0.2)	
ගිවිසුම් ගත සේවා	11.1	17.3	(6.2)	
අනෙකුත් පුනරාවර්තන	0.8	3.5	(2.7)	
වාහන බදු කුලී	-	-	-	
අනෙකුත්	0.2	-	(0.2)	
ප්‍රාග්ධන වියදම්	**2.5**	**0.09**	**(3.2)**	**(12)**
කාර්යාල උපකරණ	2.0	-	(2.0)	
මෝටර් රථ	-	-	-	
පරිගණක මෘදුකාංග	0.5	0.09	(4.9)	
සමස්ථ වියදම	1723.9	1429.7	309.7	**5.50**
ශුද්ධ ඉතිරිය	**496.1**	**1,111.5**	**27.3**	**34.02**

භාරකාර මණ්ඩල හා ආයෝජන කළමණාකරන කමිටු රැස්වීම්

භාරකාර මණ්ඩල රැස්වීම් (Board of Trustees Meeting)

භාරකාර මණ්ඩල රැස්වීම් වලදී ආයතනික මෙහෙයුම් හා ප්‍රතිඵල අනුමත කරගත් අයවැය හා අදාල ප්‍රමිතීන්ට සාපේක්ෂව ඉතා සූක්ෂම ලෙස නිරීක්ෂණය කිරීම හා අධීක්ෂණය කිරීම භාරකාර මණ්ඩලය විසින් සිදුකරනු ලබයි. මෙහිදී භාරකාර මණ්ඩලය සම්මත න්‍යාය පත්‍රයක් සහ අනෙකුත් සාකච්ඡා කල කාරණා කෙරෙහි අවධානය යොමු කරයි. සියලුම භාරකාර මණ්ඩල රැස්වීම් වාර්තා සභාපතිවරයා විසින් අනුමත කොට සහතික කරයි. භාරකාර මණ්ඩලය මාස 02 කට වරක් රැස්වන අතර, අවශ්‍යතා පැන නැඟුනවිට විශේෂ භාරකාර මණ්ඩල රැස්වීම් ද පවත්වනු ලබේ. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුල දී පවත්වන ලද භාරකාර මණ්ඩල රැස්වීම් සහ භාරකරුවන්ගේ සහභාගී වූ තොරතුරු පහත පරිදි වේ.

	භාරකරු/භාරකරුවන්	තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන							
			1	2	3	4	5	6	7	8
			77	78	79	80	81	82	83	84
1	ගරු ජයන්ත ජයසූරිය මහතා	අග්‍රවිනිශ්චයකාරතුමා	*	*	*	*	*	*	*	*
2	ගරු ආචාර්ය බන්දුල ගුණවර්ධන මහතා	උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍ය	√	√	√					
		වෙළඳ අමාත්‍ය				√	√	√	√	√
3	අනුර දිසානායක මහතා	ලේකම්, උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශය	√	√	√	-	-	-	-	-
4	හද්‍රාණි ජයවර්ධන මහත්මිය	ලේකම්, වෙළඳ අමාත්‍යාංශය	√	√	√	√	√	√	√	√
5	එච්.එම්. චිත්‍රානන්ද මහතා	ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය	√	√	√	*	√	√	-	-
6	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා	පත්කල භාරකරු	√	√	√	√	√	√	√	√
7	ගුලාම් රශීඩ් මහතා	පත්කල භාරකරු	√	√	√	√	√	√	-	-
8	මහාචාර්ය කපිල පෙරේරා මහතා	ලේකම්, උසස් අධ්‍යාපන අමාත්‍යාංශය				√	√	√	√	√
9	ආචාර්ය රවින්ද්‍රනාත් ලියනගේ මහතා	පත්කල භාරකරු								√

√ - සහභාගී වූ රැස්වීම් ගනන

\- - භාරකාර මණ්ඩලයෙන් ඉවත් වී ඇත

* - සහභාගිවී නැත

ආයෝජන කමිටු රැස්වීම් (Investment Committee Meeting)

2020 වර්ෂය තුල භාර අරමුදල විසින් පත්කළ ආයෝජන කමිටුව විසින් පවත්වන ලද රැස්වීම් පිළිබඳ ප්‍රගතිය පහත පරිදි වේ.

	නම	තනතුර	නිල තනතුර	පැවැත්වූ රැස්වීම් ගණන		
				1	2	3
				5	6	7
1	අනුර දිසානායක මහතා	සභාපති	ලේකම්, උසස් අධ්‍යාපන හා නවෝත්පාදන අමාත්‍යාංශය	√	√	-
2	භද්‍රානි ජයවර්ධන මහත්මිය	සභාපති	ලේකම්, වෙළඳ අමාත්‍යාංශය			√
3	මහාචාර්ය අබේරත්න බණ්ඩාර මහතා	සාමාජික	මහාචාර්ය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය	√	√	√
4	එස්.වී.ඩී.කේසරලාල් ගුණසේකර මහතා	සාමාජික	භාරකරු/ මහපොළ අරමුදල	√	√	√
5	මංජුල ද සිල්වා මහතා	සාමාජික	ප්‍රධාන විධායක නිළධාරී / රක්ෂණ භාර අරමුදල	√	√	√
6	ගණක අමරසිංහ මහතා	සාමාජික	වරලත් ගණකාධිකරණ ආයතනයේ සමාජික			√
7	එම්.පී. බණ්ඩාර මහතා	සාමාජික	අධ්‍යක්ෂ / මහපොළ අරමුදල	√	√	√

√ - සහභාගී වූ රැස්වීම් ගනන

\- - කමිටුවෙන් ඉවත් වී ඇත

කාර්යය මණ්ඩලය

කාර්යය මණ්ඩලය

සේවා ගණය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	1	1	
ද්විතීය	6	2	4
තෘතීය	19	8	11
ප්‍රමුඛ	5	2	3
එකතුව	**31**	**13**	**18**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල අවම කාර්යය මණ්ඩල පිරිවැයක් දරණ ආයතනයක් ලෙස එහි ආරම්භයේ සිටම ඉතා සීමිත කාර්යය මණ්ඩලයක් මගින් කටයුතු කරන අතර කාර්යය මණ්ඩල පරිපාලන වියදම ආදායමෙන් 0.26% ක් වූ අතර වියදමින් 0.40% වැනි ඉතා අවම මට්ටමක තබා ගත හැකි විය.

කාර්යය මණ්ඩලයෙහි දැනට පවතින ඇබෑර්තු අභ්‍යන්තර උසස් කිරීම් මගින් පිරවීමටත් ඉන්පසු ඇතිවන තනතුරු සඳහා ඇබෑර්තු බාහිර අයදුම්කරුවන්ගෙන් පිරවීමටත් භාරකාර මණ්ඩලය තීරණය කර ඇත.

සමාලෝචිත වර්ෂයේදී මහපොළ අරමුලේ කාර්ය මණ්ඩල හා ආයතනයේ ව්‍යුහය පිලිබඳ සමාලෝචනය විෂයභාර අමාත්‍යාංශය වූ වෙළඳ අමාත්‍යාංශය විසින් සිදු කල අතර මහපොළ අරමුදලේ ආයතන ව්‍යුහය හා සිටිය යුතු කාර්ය මණ්ඩලය නිර්දේශ කරන ලදි. එය භාරකාර මණ්ඩලය විසින් අනුමත කොට ඇත.

2020 ජනවාරි මස මහපොළ අරමුදලේ කාර්ය මණ්ඩලයේ සියලුම තනතුරු කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව මගින් අනුමත කර ගත යුතු බව වෙළඳ අමාත්‍යවරයා විසින් දැනුම් දුන් අතර එයට අදාල ඉල්ලීම කළමනාකරණ සේවා දෙපාර්තුමේන්තුව වෙත යොමු කොට තිබූ අතර 2020.12.31 දින වන විටත් එය අනුමත කොට නොතිබුණි.

මහපොළ භාරකාර අරමුදලෙහි අනෙකුත් ආයෝජන

සංවර්ධන ලොතරැයි මණ්ඩලය (Development Lotteries Board)

මහපොළ භාර අරමුදලේ රු. මිලියන 2.2 සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ආයෝජනය කොට ඇති අතර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිල බලයෙන් මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ සභාපති හෝ ඔහුගේ නියෝජිතයෙක් පත්වේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් උපයන ආදායම ජනාධිපති අරමුදලට කෙලින්ම මාරු කරන අතර ඉන්පසුව මහපොළ අරමුදලට හිමි ලාභ කොටස ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරු කරනු ලැබේ.

සංවර්ධන ලොතරැයි මණ්ඩල 2015 - 2020 ලාභය හා ජනාධිපති අරමුදල හරහා මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල වෙත මාරුකරන ලද ලාභ කොටස

විස්තරය	2015 රු.	2016 රු.	2017 රු.	2018 රු.	2019 රු.	2020 රු.
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ශුද්ධ ලාභය	**1,727.1**	**1,783.3**	**501.7**	**2,187.6**	**2,668.8**	**2,770.0**
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලට හිමි කොටස 50%	**863.6**	**891.7**	**250.9**	**1,093.8**	**1,334.4**	**1,385.0**
මහපොළ භාරකාර අරමුදල වෙත මාරු කල කොටස	**735.8**	**767.3**	**25***	**780.6**	**922.3**	**1,153.3**
තවදුරටත් ලැබිය යුතු ලාභ කොටස	127.8	124.4	225.9	313.2	412.1	231.7

* 2017 දී සංවර්ධන ලොතරැයි මණ්ඩලය විසින් ගෙවිය යුතු බදු වගකීම සඳහා රුපියල් බිලියන 1.7ක් ගෙවා ඇත. එම නිසා සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙහි ශුද්ධ ලාභය එම ප්‍රමාණයෙන් අඩුවිය. එබැවින් මහපොළ භාරකාර අරමුදල වෙත මරු කර ඇත්තේ රුපියල් මිලියන 25ක් පමණි.

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම (NWCL)

මහපොළ භාරකාර අරමුදලේ පූර්ණ හිමිකාරීත්වය යටතේ පවතින නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් (NWCL) හි රුපියල් මිලියන 200 ක් ආයෝජනය කරමින් සීමිත සමාගමක් ලෙස 2003 මාර්තු 23 වන දින සංස්ථාගත කරන ලදී. නැට්වෙල්ත් කෝපරේෂන් ලිමිටඩ් ආයෝජන කළමණාකරුවෙකු ලෙස කටයුතු කල අතර මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන කළඹ අඩු අවදානමකින් උපරිම ප්‍රතිලාභ ලබා ගැනීමේ අභිප්‍රායෙන් කළමනාකරණ ගිවිසුමක් යටතේ ලබාදෙන ලදී. එලෙස නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම විසින් කළමණාකරනය කරන ලද මහපොළ අරමුදල 2019 වර්ෂයේ ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ ඇති මහපොළ ප්‍රධාන ගිණුමට මාරුකරන ලද අතර 2019 පෙබරවාරි 28 වන දින සිට නැට්වෙල්ත් කෝපරේෂන් සමාගම සමඟ තිබූ අරමුදල් කළමනාකරණ ගිවිසුම අවලංගු කරන ලදී. 2020 වර්ෂය තුල ක්‍රියාකාරී නොවන සමාගමක් ලෙස පැවතුණි. 2020 වර්ෂය දෙස බලන විට මූල්‍ය තත්වය පහත පරිදි විය.

නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම **(NWCL)**

2020.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මෙහෙයුම් සමාලෝචනය

	රු. මි.
ආදායම	2.4
වියදම	5.2
ශුද්ධ ලාභය/ (අලාභය)	**(2.8)**

2020.12.31 දිනට මූල්‍ය තත්වය

වත්කම්	**රු. මි.**
මුදල් හා සමාන දෑ	0.8
ස්ථාවර තැන්පතු හා කෙටි කාලීන තැන්පතු	39.4
තැන්පතු, කලින් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ	38.5
අනුබද්ධ සමාගම්වල ආයෝජන - NWSL	1,148.6
අනෙකුත් වත්කම්	38.7
මුළු වත්කම්	**1,266.0**

හිමිකම් හා වගකීම්	**රු. මි.**
වියදම්	
කොටස් ප්‍රාග්ධනය	985.5
2020.12.31 දිනට රඳවා ගත් ලාභ	274.0
මුළු හිමිකම්	1,259.5
වගකීම්	6.5
මුළු හිමිකම් හා වගකීම්	**1,266.0**

නැට් වෙල්ත් සිකියුරිටීස් සමාගම (NWSL)

2015 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සමාගමට ලැබූ අලාභය හේතුවෙන් හා සමාගම පවත්වාගෙන යාමට අවශ්‍ය කාරක ප්‍රාග්ධනය හිඟය මත භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි සඳහා සහභාගී වීම අවම මට්ටමක පැවතුනි. මෙම කළමනාකරණ දුර්වලතා හේතුවෙන් හා අධ්‍යක්ෂ මණ්ඩලවල වෙනස්වීම හේතුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් NWSL සමාගමේ ප්‍රාථමික ගැනුම්කාර බලපත්‍රය මාස 06 ක් සඳහා තාවකාලිකව අත්හිටුවන ලදි. එය 2020 මැයි මස සිට 2020 නොවැම්බර් 30 දක්වා ක්‍රියාත්මක වීම හේතුවෙන් ආයතනයේ ක්‍රියාකාරීත්වයට සෘජුවම බලපෑ අතර එමඟින් ආදායම් අහිමිවීමක් ද සිදුවිය.

2020.10.26 වන දින පැවති අමාත්‍ය මණ්ඩලයේදී තීරණය කළ පරිදි NWCL සහ NWSL සමාගම් ඇවර කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව 2020.12.31 වන විට එම ඇවර කිරීමේ කටයුතු සඳහා ඇවර කමිටුවක් පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පැවතුණි. 2020 වර්ෂය දෙස බලන විට මූල්‍ය තත්වය පහත පරිදි විය.

2020.12.31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මෙහෙයුම් සමාලෝචනය

	රු. මි.
ආදායම	119.3
වියදම	68.2
ශුද්ධ ලාභය/ (අලාභය)	**51.1**

2020.12.31 දිනට මූල්‍ය තත්වය

වත්කම්	**රු. මි.**
මුදල් හා සමාන දෑ	0.9
ස්ථාවර තැන්පතු හා කෙටිකාලීන තැන්පතු	1,193.6
තැන්පතු, කලින් ගෙවීම් හා වෙනත් ලැබිය යුතු දෑ	144.3
අනෙකුත් වත්කම්	0.5
මුළු වත්කම්	**1,339.3**

හිමිකම් හා වගකීම්	**රු. මි.**
වියදම්	
කොටස් ප්‍රාග්ධනය	1,175.0
විශේෂ අවධානම් සංචිත	354.0
2020.12.31 දිනට රඳවා ගත් ලාභ	(294.4)
මුළු හිමිකම්	1,234.6
වගකීම්	104.7
මුළු හිමිකම් හා වගකීම්	**1,339.3**

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙහි ආයෝජන (SLIIT)

2015 මැයි 12 දින ඇති කර ගන්නා ලද ගිවිසුම් භාරකරුවන්ගේ නිසි අනුමැතියකින් තොරව සිදු කොට ඇති අතර ඒ පිළිබඳව විශේෂ විමර්ෂණයක් ජනාධිපති විමර්ෂණ කොමිසම විසින් සිදු කල අතර විගණකාධිපති වරයාගේ විශේෂ වාර්තාව අනුව මෙම මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ වත්කම් පැවරීම නිසි අනුමැතියකින් තොරව සිදු කොට ඇති බැවින් SLIIT හි පරිපාලනය නැවත මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදල යටතේ පිවිටුවීමට COPE කමිටුව වෙත යෝජනා කොට ඇත. දැනට SLIIT ආයතනය සතුව රු.බි. 20කට අධික දළ වත්කම් වටිනාකමක් ඇති බව නිරීක්ෂණය වන අතර ඒ සඳහා තක්සේරු වාර්තාවක් ලබා ගැනීමට මහපොළ භාරකාර මණ්ඩලය තීරණය කොට අවශ්‍ය දැනුම්දීම් සිදු කර ඇති අතර, ඒ සඳහා SLIIT හි වර්තමාන පාලන අධිකාරිය අවශ්‍ය පහසුකම් 2020.12.31 වන විට සපයා නැත. ඒ අනුව මෙම වත්කම් මත මහපොළ අරමුදලට ලැබිය යුතු ප්‍රතිලාභ අහිමි වී ඇත.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යාඪ භාර අරමුදල මඟින් ක්‍රියාත්මක කිරීමට යෝජිත නව ව්‍යාපෘති (2022 – 2025)

නව ව්‍යාපෘති (New Projects)

ව්‍යාපෘතියේ නම	ප්‍රාග්ධන ආයෝජනය	අපේක්ෂිත වාර්ෂික ආදායම
ශිෂ්‍යාඪලාභීන්ගේ දත්ත පද්ධතියක්	-	රු.මි. 500
භාෂා ඉගෙන්වීමට අදාල විශ්වවිද්‍යාල විද්‍යායතනයක්	රු.මි. 200	රු.මි. 200
විසල් වෙළෙඳ නගර ව්‍යාපෘතිය (අක්. 300)	රු.මි. 500	රු.මි. 500
විශ්ව විද්‍යාල ගම්මානයක් (අක්. 150)	රු.මි. 500	රු.මි. 200
පෙව පද්ධති තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (අක්.22)	රු.මි. 500	රු.මි. 200

- **ශිෂ්‍යාඪලාභීන්ගේ දත්ත පද්ධතියක් (Data Base)**

  දැනට ශිෂ්‍යාඪ ලබා උපාධි අවසන් කොට විශ්වවිද්‍යාල වලින් පිටව ගොස් ඇති ලක්ෂ 03 ක පමණ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් විවිධ රැකියාවල හා වෘත්තීන්වල දේශීයව හා විදේශීයව නියැලෙන බැවින් මෙම ශිෂ්‍යාඪලාභීන්ගේ දත්ත පද්ධතියක් සකස් කොට ඇති අතර එම දත්ත උපයෝගී කොටගෙන සියලුම ශිෂ්‍යාඪලාභීන් වෙත මහපොළ අරමුදල සඳහා යම් දායකඪයක් ලබාදෙන ලෙස ඉල්ලීමක් යැවීමට කටයුතු යොදා ඇත. එමඟින් අරමුදලට අතිරේකව රු.මි. 500 ක පමණ අරමුදලක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

- **භාෂා ඉගෙන්වීමට අදාල විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (Foreign Language University College)**

  සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව හා මහපොළ අරමුදලේ ස්ථාපිත අරමුණු අතර අඩු පහසුකම් සහිත යෞවනයන් උසස් අධ්‍යාපන අවශ්‍යතා සපුරා ගැනීම සඳහා හා උසස් අධ්‍යාපනය අපේක්ෂිත සියලු දෙනාටම රැකියා ඉලක්කගත උසස් අධ්‍යාපනයක් ලබාදීම වෙනුවෙන් මහපොළ අරමුදල කැපවීමෙන් සිටින අතර ඒ සඳහා විදේශ භාෂා ඉගැන්වීමට අදාල විශ්වවිද්‍යාල විද්‍යායතනයක් ආරම්භ කිරීමට සැලසුම් කොට ඇති අතර වර්ෂ 02 ක් අවසානයේ විදේශ භාෂා පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් පිරිනැමේ. මෙම ව්‍යාපෘතිය සඳහා රු.මි. 200ක් ප්‍රාග්ධන ආයෝජනය වශයෙන් යෙදවීමටඅපේක්ෂිත අතර මෙමඟින් වාර්ෂිකව රු.මි.200 ක පමණ අතිරේක ආදායමක් උපයා ගැනීමට අපේක්ෂා කෙරේ.

- **විසල් වෙළෙඳ නගර ව්‍යාපෘතිය (Trade Hub - Mihintale)**

  ගරු වර්තමාන විෂය භාර අමාත්‍යවරයාගේ සංකල්පයක් අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලය ප්‍රදේශයේ අක්ක 300 ක භූමිය තුළ විසල් වෙළෙඳ නගර ව්‍යාපෘතියක් මහපොළ අරමුදල යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කොට ඇත. මෙම ව්‍යාපෘතිය වසර 05 කින් පමණ නිම කිරීමට බලාපොරොත්තු වන අතර දැනට පිටකොටුව ප්‍රදේශයේ ස්ථාපිත තොග වෙළෙදාමෙහි කොටසක් රට මැදට රැගෙන යාමත් එමඟින් බෙදා හැරීමේ ජාලය ශක්තිමත් කිරීම තුළින් ප්‍රදේශයේ කෘෂි නිෂ්පාදන සාධාරණ මිලකට අලෙවිකර ගැනීමට ගොවි ජනතාවට පහසුකම් ලබාදෙන අතර මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රාග්ධන ආයොජනය වශයෙන් රු.මි. 500ක් යෙදවීමට අපේක්ෂිත අතර එමඟින් මහපොළ අරමුදලට රු.මි.500 ක වාර්ෂික අතිරේක ආදායම් ලබා ගැනීම අපේක්ෂා කරයි.

- **විශ්වවිද්‍යාල ගම්මානයක් (Universal University Village)**

  හෝමාගම පාදුක්ක ප්‍රදේශයේ අක්කර 122 ක පමණ භූමිය තුළ විශ්වවිද්‍යාල ගම්මානයක් ඇති කිරීමට ද සැලසුම් කොට ඇත. මෙය ද අධියර 02 කින් ආරම්භ කරන අතර පළමු අධියරේදී තාක්ෂණ විශ්ව විද්‍යාලයක් හා තාක්ෂණ දැනුම සඳහා වන පුහුණු මධ්‍යස්ථානයක් හා පර්යේෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීමට බලාපොරොත්තු වේ. මූලික ආයෝජනය රු.මි.500ක් වේ. අපේක්ෂිත වාර්ෂික ආදායම රු.මි.200 ක් වේ.

- **ජෛව පද්ධති තාක්ෂණ විශ්වවිද්‍යාල විද්‍යායතනයක් (Bio System Technology Floriculture Institute)**

  ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ විශ්ව විද්‍යාල විද්‍යායතනයක් නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹේවෙල ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු යොදා ඇති අතර එමඟින් මල් වගාව හා පළතුරු වගාව සම්බන්ධව තාක්ෂණික දැනුම ලබාදීම හා එම නිෂ්පාදන අපනයනය කිරීම මූලික අරමුණු ඇතිව මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන අතර මෙමඟින් ප්‍රදේශයේ යෞවනයන් සඳහා මල් වගාව හා පළතුරු වගාව පිළිබඳ තාක්ෂණ දැනුම ලබාදීම සඳහා පාඨමාලා ආරම්භ කරන අතර වෘත්තීය පුහුණු සහතිකයක් (NVQ) ලබාදීමට අපේක්ෂිතය. මෙම විද්‍යායතනයේ ගාස්තු අයකරන පාඨමාලා ආරම්භ කරන අතර එමඟින් අපේක්ෂිත වාර්ෂික ආදායම රු.මි.200 ක් පමණ වේ. මූලික ප්‍රාග්ධනය ආයෝජනය රු.500 ක් ලෙස ඇස්තමේන්තු කොට ඇත.

  ඉහත සියලු ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම තුළින් ඉදිරි වසර 05 ඇතුලත මහපොළ ප්‍රාග්ධන අරමුදල රු.බි.20 දක්වා වර්ධනය කිරීමටත්, වාර්ෂිකව ලබාදෙන ශිෂ්‍යාඪ සංඛ්‍යාව 30% පමණ එනම් දැනට ලබාදෙන ශිෂ්‍යාඪ 16,000 වාර්ෂිකව ශිෂ්‍යාඪ 25,000 දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. } ටීසීඑම්/එන්/එම්ටීඑන්/06/20/11

මෙම අංකය
உமது இல.
Your No. }

දිනය
திகதி
Date } 2021 ජූලි 09 දින

සභාපති
මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 10(4) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව, 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 නත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 ගිණුම්කරණ ප්‍රමිත වලින් බැහැර වීම

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 හි 49 වන ඡේදයට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගැලපුම් සිදුකරන පෙර කාලපරිඡේදයට අදාල ගැලපීම් සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළ යුතු වුවත් භාර අරමුදල විසින් ගලපන ලද එකතුව රු. 3,735, 852 ක් වූ පෙර කාලපරිඡේදවලට අදාල ගැලපීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි 25 සහ 26 ඡේද අනුව ආශ්‍රිත සමාගම් සමඟ සිදු කරනු ලබන සියළුම ගනුදෙනු විස්තරාත්මකව හෙළිදරව් කළ යුතු වුවත් අරමුදල එහි ආශ්‍රිත සමාගම් වූ නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, නැවිවෙල්ත් සිකියුරිටිස් සමාගම හා සංවර්ධන ලොතරැයි මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 හි 4.1.1 ඡේදය ප්‍රකාරව මූල්‍ය වත්කම් එහි ක්‍රමක්ෂය පිරිවැය, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකම, ලාභය හෝ අලාභය තුලින් සාධාරණ වටිනාකම යනාදී වශයෙන් වර්ගකර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් වටිනාකම් රු. 5,586,821,233 ක් වූ මූල්‍ය වත්කම් එසේ දක්වා නොතිබුණි.

1.2.2. ගිණුම්කරණ අඩුපාඩු

(අ) භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැවිවෙල්ත් සිකියුරිටිස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේදී රු. 12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණි.

(ඇ) 2021 මාර්තු 17 දිනැති ජනාධිපති අරමුදලේ අංක PS/PA/5/36/vol-iv/2021 දරන ලිපිය අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් හාර අරමුදලට සමාලෝචිත වර්ෂයට අදාල ලාභ කොටස රු. 1,305,156,751.50 ක් වූවත් මූල්‍ය ප්‍රකාශනයේ එය රු. 1,262,598,395 ලෙස දැක්වීම නිසා රු. 42,558,356 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඈ) ජනාධිපති අරමුදලින් දන්වා එවා තිබූ පරිදි 2020 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු හිඟ ලාභ කොටස රු.262,149,615 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශනවල එය රු. 109,302,245 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 152,847,370 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම රු. 296,318,766 ක් වුවද හාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන වල රු. 287,876,625ක් ලෙස දක්වා තිබීමෙන් රු. 8,442,141 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.*

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අරමුදලේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුලත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අරමුදලේ 2020 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ නම්, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. මේ සම්බන්ධයෙන් මට වාර්තා කිරීමට කිසිවක් නැත.

අරමුදලේ 2020 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුලත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අරමුදල ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අරමුදල පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත. මෙම වාර්තාවේ 1.2.1 අ, ආ, ඇ සහ 1.2.2. අ, ආ ඡේදයේ දැක්වෙන නිරීක්ෂණයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අරමුදලට සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණය හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
කළමනාකරණ විගණන වක්‍රලේඛ	
2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන වක්‍රලේඛය	වක්‍රලේඛය ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගණුදෙනු හා ක්‍රියාකාරිත්වය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අරමුදලේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 වෙනත් විගණන නිරීක්ෂණ

(අ) පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු. 3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී ගෙන නොතිබුණි.

(ආ) අරමුදල් කළඹ සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීම හාර අරමුදලේ ආයෝජන කමිටුව විසින් සිදු කරනු ලබන නමුත් සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධ ගාස්තු වශයෙන් ලංකා බැංකුව වෙත රු. 2,592,000 ක අධික වියදමක් දරා තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) 2016 සැප්තැම්බර් 15 දින අවලංගු කර තිබූ මාර්ග ගත ලොතරැයිය සම්බන්ධයෙන් ඕගනික් ගේම් පෞද්ගලික සමාගමෙන් රු. මිලියන 791 ලැබිය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් නඩුවක් ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින අතර සමාලෝචිත වර්ෂයේදී නීති උපදේශක ගාස්තු ලෙස රු 2,344,514 ක් ගෙවා තිබුණි.

(ඈ) ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන්) සීමිත සමාගම (SLIIT) සමග 2005 නොවැම්බර් 14 සහ 2015 මැයි 12 දින එළඹී ගිවිසුම් සහ 2017 අතිගරු ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කල අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අනුමැතිය අනුව හාර අරමුදලට SLIIT ආයතනය සම්බන්ධයෙන් තිබූ අයිතිය අහිමි කර තිබූ අතර 2015 එළඹී ගිවිසුම නීත්‍යානුකූල නොවන බවට විමර්ෂණයක් අල්ලස් හා දූෂණ විමර්ෂණ කොමිසමේ විභාග වෙමින් පවති. තවද ජනාධිපති විශේෂ විමර්ෂණ කොමිෂන් සභාව යටතේ ඒ සම්බන්ධයෙන් පැවති විමර්ෂණය අවසන් වී එම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ලබා දී තිබූ අතර 2021 ජනවාරි 08 දින පැවති පොදු ව්‍යාපාර කාරක සභා රැස්වීමේදී ප්‍රකාශ කර තිබූ පරිදි තොරතුරු තාක්ෂණ ආයතනය සම්බන්ධයෙන් මහපොළ හාර අරමුදලට ඇති අයිතිය සම්බන්ධයෙන් වාර්තාවක් ද පාර්ලිමේන්තුවේ විවාදයක් සඳහා ඉදිරිපත් කර තිබුණි. එසේ වුවද ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය පිහිටි මහපොළ හාර අරමුදලට අයත් භූමියේ වර්තමාන වටිනාකම තක්සේරු කර ගැනීමට නොහැකි වී ඇති අතර SLIIT ආයතනයේ වර්තමාන පාලක මණ්ඩලය සාකච්ඡාවක් සඳහා කැඳවා තිබුණත් ඔවුන් විසින් ඊට සහභාගී වීම ප්‍රතික්ෂේප කරන බව ලිඛිතව දන්වා එවා තිබුණි.

(ඉ) මහපොළ හාර අරමුදලට රු. 985,500,070 ක කොටස් ප්‍රාග්ධනයක් හිමි නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ එහි උප සමාගමක් වූ මහ බැංකුවේ ප්‍රාථමික ගැණුම්කරුවකු ලෙස කටයුතු කල නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම දිගින් දිගටම අලාභ ලබන තත්වයක් පැවතීම මත ඇවර කලයුතු බව 2020 නොවැම්බර් 03 දිනැති අංක අමප/20/1367/313/011 දරණ අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව මඟින් තීරණය කර තිබුණි. ඒ අනුව 2021 පෙබරවාරි 28 දින සේවකයින්ගේ සේවය අවසන් කර නියමිත වන්දි මුදල් ගෙවීමට කටයුතු කර තිබුණි. කෙසේ වුවත් 2021 ජනවාරි 08 දින පැවති පොදු ව්‍යාපාර කාරකසභාවේ නිර්දේශය වූයේ සමාගම් සම්බන්ධයෙන් අධිකරණවල ඇති නඩු සහ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වංචා දූෂණ සම්බන්ධයෙන් ඇති පැමිණිලි විභාග අවසන් වන තෙක් සමාගම් ඇවර කිරීම තාවකාලිකව නවත් වන ලෙසය. එහිදී භාරකාර මණ්ඩලයේ හා අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ඇවර කිරීමේ අනෙකුත් කටයුතුවලට බාධාවක් නොවන බව සඳහන් කරන ලදී. ඒ අනුව ඇවරකරුවකු පත්කිරීමේ කාර්ය නවතා තිබුණි.

(ඊ) නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම සහ නැට්වෙල්ත් සෙකියුරිටීස් සමාගම් සම්බන්ධයෙන් වර්තමාන වටිනාකම් ගණනය කිරීම සඳහා විගණනයක් පෞද්ගලික ආයතනයක් ලවා සිදුකර තිබුණි. ඒ සඳහා ගාස්තු වශයෙන් රු. 3,769,451 ක් ද, නීති ගාස්තු රු. 1,744,249 ක් සහ ඇවරකිරීමේ ගාස්තු රු. 60,000 ක් ද එම සමාගම විසින් ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුලදී භාර අරමුදල විසින් ගෙවා තිබුණි. තවද අරමුදල විසින් එය ලැබිය යුතු මුදලක් ලෙස ගිණුම්ගත කර තිබුණ ද එම සමාගම් ගිණුම්වල ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(උ) අරමුදලේ ආයෝජන සම්බන්ධයෙන් විශේෂඥ දැනුමැති කළමනාකරුවකු බදවා ගැනීමට කටයුතු කර නොමැති අතර අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය 31 වුවත් සත්‍ය කාර්ය මණ්ඩලය 13ක් වූයෙන් පවතින පුරප්පාඩු 18 පිරවීමට සමාලෝචිත වර්ෂයේදී කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

විගණන පිළිතුරු

1.4.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
1. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව පෙර කාලපරිඡේදයට අදාල ගැලපීම් සම්බන්ධයෙන් ඒවායේ ස්වභාවය හා ප්‍රමාණය මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කළ යුතු වුවත් භාර අරමුදල විසින් ගලපන ලද එකතුව රු.3,735,852 ක් වූ පෙර කාලපරිඡේදවලට අදාල ගැලපීම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	එකඟ වේ 2021 වර්ෂයේ ගිණුම් කටයුතු ආරම්භ කර ඇති අතර එම ගිණුම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 ට අනුකූලව ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.	2021 වර්ෂයේ සිට ඉදිරියට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන හා වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.
2. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 ට අනුව සම්බන්ධිත පාර්ශවයන් සමඟ සිදු කරන ලද ගණුදෙනු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරවු කළයුතු වුවත් භාර අරමුදල විසින් සම්බන්ධිත පාර්ශවයන් වන ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ (ඇපයෙන් සීමිත) සමාගම, නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම, නැට්වෙල්ත් සිකියුරිටීස් සමාගම හා සංවර්ධන ලොතරැයි	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	NWSL/NWCL සමාගම් මහපොළ අරමුදලේ 100% පූර්ණ හිමිකාරීඩය දරණ සමාගම් වන අතර SLIIT / DLB ආයතන මහපොළ අරමුදලේ ආයෝජනයකි. SLIIT හි බදුකුලී ආදායම ගිණුම්වල දක්වා ඇති අතර DLB ලාභාංශ ද දක්වා ඇත. NWSL/NWCL හි ගනුදෙනු වෙනමම සටහන් ලෙස ගිණුම් ප්‍රකාශනවල ඉදිරිපත් කොට ඇති	ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය.	ඉදිරියේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.

මණ්ඩලය සමඟ සිදුකර තිබූ ගණුදෙනු හෙලිදරව් කර නොතිබුණි.			අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 ට අනුව සම්බන්ධිත පාර්ශව වෙනමම ගිණුම් ප්‍රකාශවල දක්වා නැත. ඉදිරි වර්ෂවල දී අදාල ගිණුම්කරණ ප්‍රමිත අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත.		
3. මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති එකතුව රු. 5,586,821,233 ක් වූ මූල්‍ය වත්කම් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 09 ට අනුව ක්‍රමක්ෂය අගයට දක්වා තිබිය යුතු වුවත් එසේ දක්වා නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	එකඟ වේ. ඉදිරියේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාල වාර්තා කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.	ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත වලට අනුකූල විය යුතුය.	ඉදිරියේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව අදාල වාර්තා කිරීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.

1.4.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
1. භාර අරමුදලේ පූර්ණ අයිතිය සහිත පරිපාලන සමාගම් දෙකක් වන නැෂනල් වෙල්ත් කෝපරේෂන් හා නැට්වෙල්ත් සිකියුරිටීස් යන සමාගම් සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 2013 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මහපොළ අරමුදලේ ඇති උප සමාගම් 02 වන NWSL හා NWCL සමාගම් ඇවර කිරීම සඳහා මහපොළ භාරකාර මණ්ඩලයේ ඉල්ලීම මත අමාත්‍ය මණ්ඩලය අනුමත කොට ඇති අතර මෙම සමාගම් 2020 වර්ෂය තුල ක්‍රියාකාරීතවයක්	2020 වර්ෂය තුල ඇවර කර නොමැති අතර 2013 සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කල යුතුය.	2021.01.08 දින පැවති කෝප් (Cope) කමිටු රැස්වීමේ දී මේ පිළිබඳව සාකච්ඡා කල අතර ඒකාබද්ධ ගිණුම් රහිතව මහපොළ අරමුදලේ ගිණුම් හා වාර්ෂික වාර්තාව ඉදිරිපත්

			නොවූ බැවින් 2020 වර්ෂය සඳහා ඒකාබද්ධ ගිණුම් පිළියෙල කොට නැත. 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා ඒ්කාබද්ධ ගිණුම් පිළියෙල කිරීමට විගණන ආයතනයකට භාර දී ඇති අතර එම ඒකාබද්ධ ගිණුම් සම්පූර්ණ කල වහාම විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ඇත		කරන ලෙස දැන්වූ අතර 2013 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා සියලුම වාර්ෂික වාර්තා හා විගණනය කරන ලද ගිණුම් 2021.10.04 දින පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට ඇත.
2. 2005 වර්ෂයේදී රු. 12,460,179 ක් ලෙස ගිණුම්ගත කර තිබූ භාර අරමුදල සතු මාලඹේ පිහිටි අක්කර 25 ක ඉඩම සමාලෝචිත වර්ෂය වන විටත් වර්තමාන අගයට තක්සේරු කර පොත්වලට ගෙන නොතිබුණු අතර ඉඩම හා එහි ඇති සියළුම ගොඩනැගිලි උපකරණවලට අදාළව තක්සේරු වාර්තාවක් ලබාදෙන ලෙස 2020 මැයි 24 දින රජයේ ප්‍රධාන තක්සේරුකරුගෙන් ඉල්ලීමක් කර තිබුණි. වර්තමාන අගය පිළිබඳ නිවැරදි තක්සේරු වාර්තාවක් ලබා ගැනීමකින් තොරව භාර අරමුදල විසින් ගොඩනැගිලි වටිනාකම රු. 1,064,520,695 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ නොවේ. එය ගිණුම්කරණ අඩුපාඩුවක් ලෙස සැලකීම නිවැරදි නොවේ. මේ වන විටත් තක්සේරු වාර්තා ලබා ගැනීම සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවට ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කොට ඇත. මහපොළ අරමුදල විසින් මාලබේ පිහිටි SLIIT ආයතනය ඉදිකිරීම සඳහා රු.මි.373 ක මුදලක් වැය කල අතර 2015.12.31 දිනට SLIIT ආයතනයේ ගිණුමේ තිබූ ශුද්ධ වත්කම් වටිනාකම (ඉඩම, ගොඩනැඟිලි උපකරණ) ගිණුම් පොත්වලට ගෙන ඇති	ආයතනයේ නිවැරදි තත්වය මූල්‍ය ප්‍රකාශන තුලින් පෙන්විය යුතුය.	SLIIT ආයතනයෙහි පවතින පරිපාලන හා ගිවිසුම්වල අඩුපාඩු හා වත්කම් අවභාවිතය පිළිබඳ සිදුකරන ලද විශේෂ විගණන වාර්තාව 2021.01.08 දින පාර්ලිමේන්තුවේ කෝප් කමිටුව වෙත ඉදිරිපත් කොට එම Cope කමිටු වාර්තාව 2021.04.06 දින පාර්ලිමේන්තුවේ සභාගත කොට ඇත. ඊට අමතරව රාජ්‍ය ආයතනවල දූෂණ හා

			අතර SLIIT ආයතනය මහපොළ සතු වත්කමක් බැවින් මෙලෙස ගිණුම් ගත කොට ඇත. ඒ සඳහා ඉහත ගිවිසුම් වෙනස් කිරීමට අවශ්‍යතාවයක් නොමැත. කෙසේ වෙතත් SLIIT ආයතනයේ සියලුම වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීම SLIIT ආයතනය විසින් ලබාදී නොමැති බැවින් එම වත්කම් ප්‍රත්‍යාගණනය කොට ගිණුම් පොත්වලට ගැනීම සමාලෝචිත වර්ෂය තුලදී නොහැකි වී ඇත.		වංචා සොයා බලා පරීක්ෂා කිරීම සඳහා 2018 දී පත්කල ජනාධිපති කොමිෂන් වාර්තාව ද පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇත. එය පාර්ලිමේන්තුවේ විවාද කිරීමට නියමිතය. ගරු විෂය භාර අමාත්‍යවරයා විසින් SLIIT හි ඉදිරි කටයුතු පිළිබඳ නිරීක්ෂණ 2021.08.17 පාර්ලිමේන්තුවට ඉදිරිපත් කොට ඇත.
3. මූල්‍ය ප්‍රකාශන අනුව විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව ගෙවිය යුතු ගිණුමේ 2020 ජනවාරි 01 දිනට ආරම්භක ශේෂය රු. 441,644,815 ක් වූ නමුත් ලෙජරය අනුව ආරම්භක ශේෂය රු. 441,585,464 වූ අතර වෙනස රු. 109,351 ක් විය.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	2019 වර්ෂයේ ශිෂ්‍යත්ව ගෙවීම් වලට ඇතුලත් වූ මුදල වන රු. 4,158,565 ක් කෙටිකාලීන වගකීම් වලට ඇතුලත් කර ඇත. මෙය 2021 වර්ෂයේ ගිණුම්වලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත.	ආරම්භක ශේෂ නිවැරදිව දැක්විය යුතුය.	ඉදිරි ගිණුම් වර්ෂවලදී නිවැරදිව ගිණුම් පිළියෙල කිරීමට කටයුතු කරනු ඇත.
4. රු.71,421 ක් වූ ලැබිය යුතු පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොළී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ නොවේ. ගිණුම්ගත කර ඇත.	සමාලෝචිත වර්ෂයට අදාල ආදායම නිවැරදිව	2021 වර්ෂයේ දී ගිණුම්වල අදාල නිවැරදි කිරීම සිදුකරනු ඇත.

				හදුනාගෙන ගිණුම්ගත කළ යුතුය.	
5. රු. 215,000,000 ක් වූ 2020 දෙසැම්බර් 30 සිට 2021 ජනවාරි 08 දක්වා වූ භාණ්ඩාගාර බිල්පතේ 2020 දෙසැම්බර් 30 දිනට අදාල පොලී ආදායම රු. 26,507 ක් වුවද සමාලෝචිත වර්ෂයට අදාල ආදායම ලෙස රු. 238,865 ක් ගිණුම්ගත කිරීම නිසා රු. 212,358 ක් වැඩියෙන් දක්වා තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ නොවේ. නිවැරදිව ගිණුම්ගත කොට ඇත.	සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කල යුතුය.	2021 වර්ෂයේ ආදායම් නිවැරදිව ගිණුම්ගත කොට ඇත.
6. 2021 මාර්තු 17 දිනැති ජනාධිපති අරමුදලේ අංක PS/PA/5/36/vol-iv/2021 දරන ලිපිය අනුව සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් භාර අරමුදලට අදාල ලාභ කොටස රු. 1,490,445,755 ක් වුවද නිවැරදි ගණනය කිරීමකින් තොරව රු. 1,262,598,395 ලෙස මූල්‍ය ප්‍රකාශන වල දැක්වීම නිසා රු. 227,847,360 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ නොවේ. වාර්තාවේ දක්වා ඇති සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ සමාලෝචිත වර්ෂයට අදාල ලාභ කොටස වශයෙන් දක්වා ඇති රු.1,490,445,755.00 ක මුදල නිවැරදි නොවන අතර එය 2019 හා 2020 වර්ෂයට අදාලව ලැබුණු මුදල හා ලැබිය යුතු මුදලේ එකතුවකි. කෙසේ වෙතත් 2020 වර්ෂයේ ගිණුම් පිළියෙල කරන අවස්ථාවේදී ශේෂ තහවුරු කිරීම් ජනාධිපති අරමුදල මඟින් ඉල්ලා සිටියත්	මහපොළ භාර අරමුදලට හිමි ලාභ කොටස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේ සිට ඉදිරියට වර්ෂය අවසානයේ ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම්වල ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.

			එම ශේෂ තහවුරුව 2021 මාර්තු 17 දිනැති ලිපිය අනුව 2021 මාර්තු 25 දින ලැබී ඇත. ඒ අනුව මහපොළ අරමුදල අවසන් ගිණුම් පිළියෙල කොට විගණනය සඳහා භාරදී තිබුණි. කෙසේ වෙතත් මෙම ශේෂ තහවුරු ලිපියට අනුව අදාල ගැලපීම් 2021 වර්ෂයේ දී සිදුකරනු ඇත. 2020 ගිණුම් වර්ෂය සඳහා දක්වා ඇත්තේ 2020 වර්ෂය තුළ ලැබූ ප්‍රමාණය හා ජනාධිපති අරමුදල මඟින් අවසන් සැසඳුම් වාර්තා සකස් කිරීමට පෙර 2020 වර්ෂය වෙනුවෙන් තවදුරටත් ගෙවීමට ඇති මුදලක් වශයෙන් ලද රු.109,302,244.91 ක් එකතු කිරීමෙනි. ඒ අනුව 2020 වර්ෂයේ ගිණුම්වල දක්වා ඇති ලාභ කොටස් නිවැරදි ලෙස සැසඳුම් වාර්තා සමඟ ගලපා 2021 වර්ෂයේදී පෙර වර්ෂ ගැලපීමක් ලෙස ඉදිරිපත් කරමි.		

7. 2020 දෙසැම්බර් 31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු හිඟ ලාභ කොටස ජනාධිපති අරමුදලින් දන්වා එවා තිබූ පරිදි රු.262,149,615 ක් වූ නමුත් මූල්‍ය ප්‍රකාශන වල එය රු. 109,302,245 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 152,847,350 ක් අඩුවෙන් දක්වා තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ වේ. 2020.12.31 දිනට සංවර්ධන ලොතරැයි මණ්ඩලයෙන් ලැබිය යුතු ලාභාංශ මුදල තහවුරු කරන මෙන් ඉල්ලීම් කර තිබුණත් ජනාධිපති අරමුදල මඟින් තහවුරු කිරීමට 2021.02.28 දක්වා අපොහොසත් විය. එබැවින් මෙය නිවැරදිව ගිණුම්ගත කිරීමට නොහැකි විය.	මහපොළ භාර අරමුදලට ජනාධිපති අරමුදලින් එවා නොමැති ලාභ කොටස මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට පෙර ගණනය කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 වර්ෂයේ සිට ඉදිරියට වර්ෂය අවසානයේ ශේෂ තහවුරු කිරීම් ලබාගෙන ගිණුම්වල ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ඇත.
8. සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු සඳහා පොළී ආදායම රු. 296,318,766 ක් වුවද භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශන වල රු. 287,876,625ක් ලෙස දක්වා තිබීමෙන් රු. 8,442,141 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ නොවේ අදාල ගැලපීම් 2021 වර්ෂයට පෙර වර්ෂ ගැලපීම් ලෙස ඉදිරිපත් කරනු ඇත.	සමාලෝචිත වර්ෂයට අදාල ආදායම් නිවැරදිව හඳුනාගෙන ගණනය කළ යුතුය.	2021 වර්ෂයේ සිට ඉදිරියට ස්ථාවර තැන්පතු පොළී ආදායම නිවැරදිව ගිණුම්ගත කිරීම සිදුකරනු ඇත.
9. රු. 915,387 ක් වූ 2019 වර්ෂයට අදාල custodian fees සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ වේ. ඉදිරි වර්ෂයේදී පෙර වර්ෂවල ගැලපීම නිවැරදි කරනු ඇත.	පෙර වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කළ යුතුය.	එකඟවේ. ඉදිරි වර්ෂයේදී පෙර වර්ෂවල ගැලපීම නිවැරදි කරනු ඇත.

10. 2013 සිට 2018 දක්වා කාලපරිච්ඡේදයට අදාලව 2020 වර්ෂයේදී ගෙවූ රු. 657,000 ක් වූ විගණන ගාස්තු සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	එකඟ වේ. ඉදිරි වර්ෂයේදී පෙර වර්ෂවල ගැලපීම් නිවැරදි කරනු ඇත.	පෙර වර්ෂ ගැලපීම් ලෙස ගිණුම්ගත කළ යුතුය.	එකඟවේ. ඉදිරි වර්ෂයේදී පෙර වර්ෂවල ගැලපීම් නිවැරදි කරනු ඇත.

1.4 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.4.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
පාසල් කිහිපයක සිදු කරනු ලැබූ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් පාසැල් සංවර්ධන අරමුදලින් ගෙවිය යුතු වියදම් ලෙස එකතුව රු. 3,832,875 ක් 2013 වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබූ අතර ඒ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සමාලෝචිත වර්ෂයේදී ගෙන නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	මෙම පාසැල් සංවර්ධන කටයුතුවල ඉදිකිරීම් සතොස ආයතනය යටතේ පිහිටුවා තිබූ සමාගමක් මඟින් සිදුකල අතර සියලු බිල්පත් නිරවුල් කිරීම් එම ආයතනය හරහා සිදුකර ඇත. කෙසේ වෙතත් මෙම ගෙවිය යුතු ලෙස දක්වා ඇති රු.3,832,875.00 පියවීමට අදාල බිල්පත් හා කොන්ත්රාත්කරුවන්ගේ ඉල්ලීම් මෙතෙක් ඉදිරිපත් කොට නැත. ඒ අනුව මෙම බිල්පත් නිරවුල් කිරීම ප්‍රමාද වී ඇත.	සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුය.	ප්‍රසම්පාදන ක්‍රියාවලියේ අඩුපාඩු සිදුවී ඇති බැවින් හා ණයහිමියන්ගේ බිල්පත් ඉදිරිපත් කොට නැති බැවින් ගෙවීම් කිරීමට නොහැකිවී ඇත.

1.5 මුදල් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
අරමුදල් කළඹ සම්බන්ධයෙන් ආයෝජන තීරණ ගැනීම හාර අරමුදලේ ආයෝජන කමිටුව විසින් සිදු කරනු ලබන නමුත් සමාලෝචිත වර්ෂයේදී ඒ සම්බන්ධ ගාස්තු වශයෙන් ලංකා බැංකුවෙත රු. 2,592,000 ක් ගෙවීම තුලින් අනාර්ථික වියදමක් දරා තිබූ බව නිරීක්ෂණය විය.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍යවේ	මහපොළ අරමුදලේ ආයෝජන කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීම ආයෝජන කළමනාකරණ කමිටු විසින් ගනු ලබන අතර එම ආයෝජන සිදුකල පසු එම ආයෝජනවලට අදාල සහතික පත්‍ර හා ස්ථාවර තැන්පතු සහතික හා බැඳුම්කරවලට අදාල සටහන් සුරක්ෂිතව ලංකා බැංකුවේ ආයතනික ශාඛාවේ තබා ඇති අතර මේ සඳහා මහපොළ භාරකාර මණ්ඩලයේ අනුමැතිය යටතේ Custodian ගිවිසුමකටද එළඹ ඇත. 2020.12.31 දිනට අරමුදලේ ප්‍රමාණය රු.බි.11.8 ක් පමණ වන බැවින් හා මෙම ස්ථාවර තැන්පතු සහතික සඳහා අනෙකුත් ලේඛණ තබා ගැනීම වෙනුවෙන් මෙම ගාස්තුව අය කරනු ලැබේ. මේ නිසා අනවසරයෙන් කිසිම බාහිර	අනාර්ථික වියදම් නොදැරීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේ දී මුදල් ගෙවීමකින් තොරව එම පහසුකම් ලබා ගැනීමට අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීමට යෝජනා කොට ඇත.

			පාර්ශවයකට මෙම ලේඛණ ලබා ගැනීමට හැකියාවක් නොමැත. ඒ අනුව මෙම වියදම අරමුදලේ ආරක්ෂාව වෙනුවෙන් වැයකරන බැවින් එය අනාර්ථික වියදමක් ලෙස දැක්වීමට එකඟ නොවේ.		

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,085,347,967 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 755,972,796 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 329,375,171 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සංවර්ධන ලොතරැයි ආදායම ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 265,251,785 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
i. සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභයෙන් සියයට 60 ක් භාර අරමුදලට ලබා ගැනීමටත් ලාභ කොටස සෘජුව මහපොළ අරමුදලට ලබා ගැනීමටත් අදාලව සංවර්ධන ලොතරැයි මණ්ඩල පනත සංශෝධනය කිරීමට සහ මහපොළ නමින් මුද්‍රිත ලොතරැයියක් ආරම්භ කිරීමට හා සුපිරි වෙළඳසැලවල් හා ස.තො.ස. වෙළඳසැල් නියෝජිත ආයතන ලෙස පත්කිරීමට කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණ ද එම කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	සංවර්ධන ලොතරැයි මණ්ඩල ලාභයේ 60% ලබා ගැනීම අමාත්‍ය මණ්ඩල අනුමත කලත් ඒ සඳහා ජනාධිපති අරමුදලේ එකඟතාවය ලබාගත යුතු විය. Covid-19 වසංගත තත්ත්වය හමුවේ එය ප්‍රමාද විය. නව මංගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගත යුතුව ඇත.	සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021.10.01 දින පැවති භාරකාර මණ්ඩල රැස්වීමේ දී නව මංගත ලොතරැයියක් ආරම්භ කිරීමට අනුමැතිය ලබාදී ඇත. ඒ අනුව සංවර්ධන ලොතරැයි ලාභ 60% ඉහළ දැමීමට අදාල සාකච්ඡා නවතා ඇත. නව මංගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීමේ දී මේ සියලුම ආයතන සම්බන්ධ කර ගැනීමට තීරණය කොට ඇත.

ii. ශ්‍රී ලංකා ටෙලිකොම්, මොබිටෙල්, ඩයලොග් සමාගම් එක්ව එම ආයතන නියෝජිත ආයතන ලෙස පත් කරමින් මාර්ගගත ලොතරැයියක් ආරම්භ කර සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ පරිගණක ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ නමුත් එවැන්නක් සිදු කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	කෙවිඩ් - 19 වසංගත තත්ත්වය මත මෙම වැඩ කටයුතු ප්‍රමාද විය. දැනට කටයුතු කරමින් පවතී. නව ලොතරැයිය පැවැත්වීමට සුදුසු ලොතරැයිකරුවකු තෝරා ගන්නා බැවින් මහපොළ අරමුදල යටතේ වෙනමම පරිගණක ඒකකයක් පිහිටුවීම අවශ්‍ය නොවේ	සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	නව මංගත ලොතරැයිය ක්‍රියාත්මක කිරීමේ දී මේ සියලුම ආයතන සම්බන්ධ කර ගැනීමට යෝජනා කොට ඇත. නව ලොතරැයිය පැවැත්වීමට සුදුසු ලොතරැයිකරුවකු තෝරා ගන්නා බැවින් මහපොළ අරමුදල යටතේ වෙනමම පරිගණක ඒකකයක් පිහිටුවීම අවශ්‍ය නොවේ.
iii. දේශීය හා විදේශීය ශිෂ්‍යත්වලාභීන්ට ඔවුන්ගේ ආධාර මුදල් සෘජුව භාර අරමුදලට ලබාදිය හැකි මාර්ගස්ථ ගෙවීම් ක්‍රමයක් ඇති කරන බව සැලැස්මේ සඳහන් කර තිබුණද එසේ කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත මෙම වැඩ කටයුතු ප්‍රමාද විය. දැනට කටයුතු කරමින් පවතී.	සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	2021 වන විට දැනට ශිෂ්‍යත්ව ප්‍රදානය කොට ඇති 250,000 ක පමණ ශිෂ්‍යත්ව සංඛ්‍යාවක දත්ත පරිගණකගත කොට ඇති අතර භාරකාර මණ්ඩල අනුමැතිය යටතේ වෙනමම ඒකකයක් පිහිටුවා ඇත. ඒ සඳහා සුදුසු

					නිලධාරියෙකු පත් කිරීමට අවශ්‍ය කටයුතු කරමින් පවතී. ඉන්පසු සියලුම ශිෂ්‍යත්වලාභීන්ගෙන් ආධාරයක් ලබා ගැනීම සඳහා කටයුතු කරනු ඇත.
iv. දානපතියකු විසින් කරනු ලබන දායකත්වයක් මත ශිෂ්‍යත්ව අරමුදලක් හෝ පොදු කැපකරු ශිෂ්‍යත්ව අරමුදල් පිහිටුවීම මගින් විශ්ව විද්‍යාල නොවන උසස් අධ්‍යාපන ආයතනවල ඉගනුම ලබන අඩු ආදායම්ලාභී සිසුන්ට ශිෂ්‍යත්ව ලබා දීමට කටයුතු කරන බව ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර තිබුණ ද එසේ සිදු කර නොතිබුණි.	නව	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මහජන බැංකු හරහා මාර්ග ගත ගෙවීම් ක්‍රමය ලබා ගැනීමට භාරකාර මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර අදාල ගිවිසුම්වලට එළඹීම කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රමාද වී ඇත.	සැලසුම් කළ පරිදි එම කාල රාමුව තුලදී ඉටු කර ගැනීමට කටයුතු කළ යුතුය.	මහපොළ භාරකාර අරමුදල නැවත වෙළෙඳ ප්‍රදර්ශන ආරම්භ කිරීමට අනුමත කොට ඇති අතර රට යථා තත්ත්වයට පත්වූ වහාම වෙළෙඳ ප්‍රදර්ශන තුළ මෙම අරමුදල් ප්‍රවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.
v. 2016 සැප්තැම්බර් 15 දින අවලංගු කර තිබූ මාර්ග ගත ලොතරැයිය සම්බන්ධයෙන් ඕගනික් ගේම් පෞද්ගලික සමාගමෙන් රු. මිලියන 791 ලැබිය යුතුව තිබුණි. මේ සම්බන්ධයෙන් නඩුවක්	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ.	මෙම නඩු කටයුතු තවම අවසන් වී නොමැත.	අවම නීති ගාස්තු වැයවන පරිදි කටයුතු කළ යුතුය.	ඕෂනික් ගේම්ස් සමාගම මඟින් හිඟ හිටි ලැබිය යුතු රු.මි.791 ලබා ගැනීම සඳහා මූලික පියවර වශයෙන්

ශ්‍රේෂ්ඨාධිකරණයේ විභාග වෙමින් පවතින අතර සමාලෝචිත වර්ෂයේදී නීති උපදේශක ගාස්තු ලෙස රු 2,344,514 ක් ගෙවා තිබුණි.					එන්තරවාසියක් 2018 වර්ෂයේ දී ඕෂනික් ගේම්ස් සමාගම වෙත යවා ඇති අතර දැනට ඕෂනික් ගේම්ස් සමාගම විසින් බෙරුම්කරණයක් ආරම්භ කොට ඇති බැවින් එම බෙරුම්කරණ මණ්ඩලය ස්ථාපිත කල වහාම මෙම හිඟ හිටි ලැබිය යුතු මුදල සම්බන්ධයෙන් කටයුතු කරනු ඇත. මහජන බැංකු හරහා මාර්ග ගත ගෙවීම් ක්‍රමය ලබා ගැනීමට භාරකාර මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර අදාල ගිවිසුම්වලට එළඹීම කොවිඩ් - 19 වසංගත තත්ත්වය හමුවේ ප්‍රමාද වී ඇත

3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව සෑම ප්‍රසම්පාදන අස්ථිත්වයක් විසින්ම ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කළ යුතු අතර එහි අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු, ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කර තිබිය යුතු වුවත් භාර අරමුදල විසින් ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.	පවත්නා	පවත්නා පද්ධතිය වැඩිදියුණු කිරීම අවශ්‍ය වේ	මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලේ ප්‍රසම්පාදන කටයුතු සලකා බැලීමේදී එදිනෙදා කටයුතු සඳහා අවශ්‍ය ලිපිද්‍රව්‍ය හා අනෙකුත් මිලදී ගැනීමට අදාල ප්‍රසම්පාදන කටයුතු හැරෙන්නට දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ ප්‍රසම්පාදන කටයුතු සිදු නොවන අතර මෙහෙයුම් කටයුතුවලට අදාල ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් සැලැස්මක් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය අනුව සිදු කිරීමට කටයුතු යොදා ඇත.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	2021 වර්ෂය සඳහා මහපොළ අරමුදලේ ප්‍රසම්පාදන කටයුතුවලට අදාලව සැලැස්මක් සකස් කොට විෂය භාර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කොට ඇත. ඒ අනුව ප්‍රසම්පාදන කටයුතු සිදුකරනු ලැබේ.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	නව නිරීක්ෂණයක් ද/ පවත්නා නිරීක්ෂණයක් ද	පාලන අවදානම් අනාවරණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වර්තමාන තත්වය
2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අරමුදලේ ගනුදෙනු හා ක්‍රියාකාරීත්වය පිළිබඳ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද විගණනයක් සිදු කර නොතිබුණි.	පවත්නා	පද්ධතිය හඳුන්වා දිය යුතුය	මහපොළ අරමුදලේ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය අභ්‍යන්තර විගණකවරයෙකු හා කාර්ය මණ්ඩල බඳවා ගැනීමට මහපොළ අරමුදලේ අනුමැතිය ලැබී ඇති බැවින් අවශ්‍ය පියවර ගනිමින් පවතින අතර 2021 අවසන් වන විට එම බඳවා ගැනීම් අවසන් කොට අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කිරීමට හැකිවනු ඇත.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකයෙන් විගණනය කළ යුතුය.	2021 වර්ෂය අවසන් වීමට පෙර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශන

2020 දෙසැම්බර් 31

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල
2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා
මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන	2020	2019
වත්කම්		රු.	රු.
ජංගම නොවන වත්කම්			
දේපළ , පිරියත සහ උපකරණ	12	870,388,263	900,600,030
අස්පෘශ්‍ය වත්කම්	13	606,180	708,209
ආයෝජන දේපළ	14	12,460,179	12,460,179
පරිපාලිත සමාගම්වල ආයෝජනය	15	985,000,000	985,000,000
වෙනත් ආයෝජන	16	2,200,000	2,200,000
මූල්‍ය වත්කම්	17	11,827,211,201	10,747,181,046
		13,697,865,823	**12,648,149,463**
ජංගම වත්කම්			
වෙනත් වත්කම්	18	5,844,020	5,724,867
අත්තිකාරම් සහ පෙර ගෙවුම්	19	1,202,085	1,658,029
ලැබිය යුතු දෑ	20	722,067,345	767,566,984
මුදල් හා මුදල් සමාන දෑ	21	72,064,231	138,160,020
		801,177,681	**913,109,900**
මුළු වත්කම්		**14,499,043,504**	**13,561,259,363**
හිමිකම් සහ වගකීම්			
හිමිකම්			
සමුච්චිත අරමුදල		10,147,376,951	10,147,376,951
රදවාගත් ඉපයීම්		4,036,947,280	2,947,863,461
මුළු හිමිකම්		**14,184,324,231**	**13,095,240,412**
ජංගම නොවන වගකීම්			
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	22	4,587,845	3,835,329
		4,587,845	**3,835,329**
ජංගම වගකීම්			
උපචිත සහ වෙනත් ගෙවිය යුතු දෑ	23	310,131,428	462,183,622
		310,131,428	**462,183,622**
මුළු හිමිකම් සහ වගකීම්		**14,499,043,504**	**13,561,259,363**

පිටු අංක 05 සිට 16 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පිටු අංක 17 සිට 24 දක්වා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශ සඳහා අත්‍යවශ්‍ය කොටසක් වේ. භාරකාර මණ්ඩලය මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වගකීම් දරයි. මෙම මූල්‍ය ප්‍රකාශන භාරකාර මණ්ඩලය විසින් අනුමත කර අත්සන් තබන ලදී.

අත්.කළේ.	අත්.කළේ.	අත්.කළේ.
භද්‍රානි ජයවර්ධන මිය	එස්.වී.ඩී.කේ.ගුණසේකර මහතා	එම්.පී.බණ්ඩාර මහතා
ලේකම්	පත්කරන ලද භාරකරු	අධ්‍යක්ෂ
වෙළඳ අමාත්‍යාංශය	මහපොළ භාර අරමුදල	මහපොළ භාර අරමුදල

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

2020 දෙසැම්බර් මස 31 න් අවසන් වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

	සටහන්	2020 රු.	2019 රු.
ආදායම්	7	2,542,964,725	2,167,588,794
සෘජු වියදම් (ශිෂ්‍යත්ව ගෙවීම්)	8	(1,391,419,416)	(1,311,706,136)
		1,151,545,309	855,882,658
වෙනත් ආදායම්	9	52,640	77,727
මුළු ආදායම		**1,151,597,949**	**855,960,385**
පරිපාලන වියදම්	10	(66,178,257)	(63,253,113)
මූල්‍ය පිරිවැය	11	(71,725)	(37,021,388)
මුළු වියදම		**(66,249,982)**	**(99,987,589)**
බදු ගෙවීමට පෙර අතිරික්තය / (ඌනතාවය)		**1,085,347,967**	**755,972,796**
ආදායම් බදු වියදම්		-	-
බදු ගෙවූ පසු ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)		**1,085,347,967**	**755,972,796**
වෙනත් විස්තීර්ණ ආදායම්			-
වර්ෂයේ විස්තීර්ණ ආදායම ලද පසු ශුද්ධ අතිරික්තය		**1,085,347,967**	**755,972,796**

පිටු අංක 05 සිට 24 දක්වා පවතින ගිණුම් ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශ සඳහා අත්‍යවශ්‍ය කොටසක් වේ.

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල

2020 දෙසැම්බර් 31 වර්ෂයෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	2020 Rs.	2019 Rs.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රමාණය		
ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)	1,085,347,967	755,972,796
ගැළපුම් :		
ක්ෂය	30,769,145	29,715,489
පාර්තෝෂික	752,515	662,569
පූර්ව වර්ෂයේ ගැළපුම්	3,735,852	42,955,902
කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් අතිරික්තය / (ඌනතාවය)	**1,120,605,480**	**829,306,756**
කාරක ප්‍රාග්ධනය		
ලැබිය යුතු දෑ හි වැඩිවීම් / අඩුවීම්	45,836,430	(613,545,140)
ගෙවිය යුතු දෑ හ ිවැඩිවීම් / අඩුවීම්	(152,052,194)	315,878,208
ශුද්ධ කාරක ප්‍රාග්ධන වෙනස්වීම්	(106,215,764)	(297,666,932)
මෙහෙයුම් කාර්යයන්ගෙන් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායෑම්)	**1,014,389,716**	**531,639,824**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ		
දේපළ , පිරියල සහ උපකරණ ලබාගැනීම්	(377,850)	(16,426,582)
අස්පෘශ්‍ය වත්කම් ලබාගැනීම්	(77,500)	(708,209)
මූල්‍ය වත්කම් (ආයෝජන / (ආපසුගැනීම්)	(1,080,030,155)	(516,953,338)
ආයෝජන ක්‍රයාකාරකම්වලින් ශුද්ධ මුදල් ගලාඒම් / (ගලායෑම්)	**(1,080,485,505)**	**(534,088,129)**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් මුදල් ගලායෑම්		
ලාභාංශ ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ගලාඒම් / ගලායෑම්	-	-
මුදල් හා මුදල් සමාන දෑ ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම්)	(66,095,789)	(2,448,303)
ජනවාරි 01 දිනට මුදල් හා මුදල් සමාන දෑ	138,160,020	140,608,323
ජනවාරි 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ	**72,064,231**	**138,160,020**

පිටු අංක 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශ සඳහා අත්‍යවශ්‍ය කොටසක් වේ.

මහාපොළ උසස් අධ්‍යාපන ශිෂත්ව භාර අරමුදල

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් ව වර්ෂය සඳහා හිමිකම් වෙනස්වීම් ප්‍රකාශය

	සමුච්චිත අරමුදල රු.	රැඳවූ පයිම් රු.	මුළු ප්‍රමාණය රු.
2019 ජනවාරි 01 දිනට ශේෂය	10,147,376,951	2,148,934,763	12,296,311,714
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්ත / (ඌනතා)	-	755,972,796	755,972,796
පූර්ව වර්ෂයේ ගැළපීම්	-	42,955,902	42,955,902
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,147,376,951**	**2,947,863,461**	**13,095,240,412**
වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය / (ඌනතාවය)	-	1,085,347,967	1,085,347,967
පූර්ව වර්ෂයේ ගැළපුම්	-	3,735,852	3,735,852
2020 දෙසම්බර් 31 දිනට ශේෂය	**10,147,376,951**	**4,036,947,280**	**14,184,324,231**

පිටු අංක 05 සිට 24 දක්වා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් මූල්‍ය ප්‍රකාශයේ අත්‍යවශ්‍ය කොටසක් වේ.

ආයතනික තොරතුරු

1.1 පොදු

ලලිත් ඇතුලත්මුදලි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල (භාර අරමුදල) 1981 අංක 66 දරන පර්ලිමේන්තු පනත යටතේ ස්ථාපනය කරන ලද භාර අරමුදලක් වන අතර මෙම භාර අරමුදලෙහි කළමනාකාරණය සහ පාලනය භාරකාර මණ්ඩලයක් වෙත පැවරී තිබේ. මෙම ආයතනය කොළඹ 07, ධර්මපාල මාවතේ අංක 191 දරන ස්ථානයේ පිහිටි ජේ.ආර්. ජයවර්ධන මධ්‍යස්ථානයේ 4 වන මහලේ පිහිටා තිබේ.

1.2 ප්‍රධාන කාර්යයන් සහ මෙහෙයුම්වල ස්වභාවය

මෙම අරමුදල වරප්‍රසාද නොලත් තරුණ තරුණියන් වෙත උසස් අධ්‍යාපනය ලබාගැනීම සඳහා ශිෂ්‍යත්ව පිරිනමනු ලබන අතර මෙන් ම වැඩිදියුණු කළ පහසුකම් ඔස්සේ උසස් අධ්‍යාපනය සඳහා සම අවස්ථා ඇති කරනු ලැබේ.

1.2.1 මහපොළ භාර අරමුදල

මෙම අරමුදලෙහි ඉලක්ක සහ අරමුණු වන්නේ -

(අ) යෞවනයෞවනියන් වෙත උසස් අධ්‍යාපනය සඳහා පහසුකම් ලබා දීම;

(ආ) ස්වකීය ද්විතීයික අධ්‍යාපනය සතුටුදායක අන්දමෙන් සම්පූර්ණ කරන ලද උසස් අධ්‍යාපනය ලැබීමට යෝග්‍ය තරුණ තරුණියන්ට අවස්ථානුකූලව තම අධ්‍යාපනික, කාර්මික හෝ තාක්ෂණික අධ්‍යාපනය විශ්වවිද්‍යාලයක, හෝ තාක්ෂණ ආයතනයක හෝ උසස් අධ්‍යාපන ආයතනයක සම්පූර්ණ කිරීම සඳහා සහයෝගය ලබාදීම;

(ඇ) යෞවනයෞවනියන්ට ස්වකීය වෘත්තීය නිපුණතා සහ ප්‍රවීණතා වැඩිදියුණු කර ගැනීමට හැකියාව සලසමින් වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම සහ කළමනාකරණයට සහයෝගය ලබා දීම;

(ඈ) පාසැල්, අධ්‍යාපන ආයතන, පදනම් සහ අධ්‍යාපන ක්ෂේත්‍රයෙහි උන්නතිය උදෙසා කටයුතු කරන එවැනි වෙනත් ආයතන ස්ථාපනය කිරීම සහ එම ආයතන කළමනාකරණය සහ පවත්වාගෙනයාම සඳහා සහයෝගය ලබා දීම; සහ

(ඉ) කථිකාචාර්යවරුන්ගේ, ගුරුවරුන්ගේ සහ අධ්‍යාපනයෙහි ඉදිරි ගමන උදෙසා කටයුතු කරන එබඳු පුද්ගලයන්ගේ නිපුණතා සහ ප්‍රවීණතාව ඉහළ නංවා ගැනීම සහ වැඩිදියුණු කිරීම සඳහා සහයෝගය ලබා දීම.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරන ලද දිනය

ලලිත් ඇතුලත්මුදලි මහපොළ ශිෂ්‍යත්ව භාර අරමුදලෙහි 2020 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සඳහා 2021.02.24 දින පැවති භාරකාර මණ්ඩලයේ යෝජනා සම්මත කිරීම ප්‍රකාරව අනුමැතිය ලබාදෙන ලදී.

2. සකස් කිරීමේ පදනම

2.1 අනුකූලතා ප්‍රකාශය

ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ සටහන් ඇතුළත්ව 2020 දෙසැම්බර් මස 31 වන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) වලින් සමන්විත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (මෙහි මින්මතු SLFRS වශයෙන් දැක්වේ) අනුකූලව සකස් කොට ඇත.

2.2 මිනුම්කරණ පදනම

වෙනත් ආකාරයකින් සඳහන් කර ඇත්තේ නම් මිස, උපචිත පදනම සහ ඓතිහාසික පිරිවැය පදනම මත මූල්‍ය ප්‍රකාශ සකස් කර තිබේ.

ආයතනයේ ව්‍යවහාරික සහ ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කර තිබේ.

2.3 ප්‍රමාණාත්මකභාවය සහ සමාහරණය

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 (LKAS 01) අනුව සමාන අයිතම වල එක් එක් ප්‍රමාණාත්මක වර්ගය මූල්‍ය ප්‍රකාශ වල වෙන වෙනම ඉදිරිපත් කොට ඇත. අසමාන ස්වභාවයෙන් හෝ කෘත්‍යයෙන් යුතු අයිතම ඒවා ප්‍රමාණාත්මක නොවන්නේ නම් හැර, වෙන් වෙන්ව ඉදිරිපත් කොට ඇත.

හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම බලාත්මක කළ හැකි නෛතික අයිතියක් පවතින්නේ නම් පමණක් මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කර මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි ශුද්ධ වටිනාකම් වාර්තා කරනු ලබන අතර එසේ සිදු කරනු ලබන්නේ ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කිරීමට සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණි. මූල්‍ය ප්‍රතිපත්තිවල විශේෂයෙන් සඳහන් කර ඇති ඕනෑම ගිණුම්කරණ ප්‍රමිතියක් අර්ථ දැක්වීමක් මඟින් නියම කර තිබේ නම් හෝ අවසර ලබාදී ඇත්නම් මිස ආදායම් ප්‍රකාශයේ ආදායම් සහ වියදම් හිලව් කරනු නොලැබේ.

2.4 සංසන්දනාත්මක තොරතුරු

නව ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS) උපයෝගී කරගැනීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් කිරීමට සිදු වූ ගිණුම්කරණ ප්‍රතිපත්ති හැර භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේ දී LKAS 01 ප්‍රකාරව පූර්ව වර්ෂයේ දී යොදා ගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම වර්ෂයේදී ද සමානුයෝගීව භාවිතා කර තිබේ. තවද, ප්‍රවර්තන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම හා අනුගත වන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍යවන තාක් දුරට ගැලපුම් කොට ඇත.

3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

භාර අරමුදල විසින් මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී උපයෝගී කරගන්නා ලද සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත දැක්වේ. පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනත් ආකාරයකින් දක්වා ඇත්නම් මිස මෙම මූල්‍ය ප්‍රකාශයන්හි දක්වා ඇති සියලුම කාල පරිච්ඡේද සඳහා සංගත ආකාරයෙන් උපයෝගී කරගෙන තිබේ.

3.1 දේපළ, පිරියත සහ උපකරණ

3.1.1 හඳුනාගැනීමේ පදනම

සේවා සැපයීමේ සහ පරිපාලන කටයුතු සඳහා භාවිතා කරනු ලබන දේපළ, පිරියත සහ උපකරණ යන ස්පෘශ්‍ය අයිතම වර්ෂයකට වඩා වැඩි කාලයක් භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් දේපළ, පිරියත හා උපකරණ හඳුනාගනු ලබන අතර වත්කම් සඳහා වන පිරිවැය විශ්වාස්‍ය භාවයෙන් යුතුව ගණනය කළ හැකිය.

3.1.2 මිනුම්කරණ පදනම

වත්කම් වශයෙන් හඳුනාගැනීමට සුදුසු දේපළ , පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක් මූලිකවම පිරිවැය අනුව මනිනු ලැබේ. අදාළ වත්කම් ලබාගැනීම සඳහා ඍජුවම ආරෝපණය කරනු ලබන වියදම සහ පසුව ඒ සඳහා කොටසක් එක් කිරීමට හෝ පැරණි කොටසක් වෙනුවට නව කොටසක් එක් කිරීම සඳහා වැය වන මුදල පිරිවැය සඳහා අන්තර්ගත වේ. ස්වයං නිර්මිත වත්කම් සඳහා අමුද්‍රව්‍ය වෙනුවෙන් වැයවන පිරිවැය සහ ඍජු ශ්‍රමය, අයිතම ගෙන ඒම, ඒවා තබනු ලබන ස්ථානයේ ස්ථානගත කිරීම සහ ප්‍රාග්ධනිත ණය ගැනීම් පිරිවැය ආදී ඍජුවම ආරෝපණය වන වෙනත් ඕනෑම ආකාරයේ පිරිවැය අන්තර්ගත වේ. මිලදී ගන්නා ලද මෘදුකාංගය අදාළ උපකරණයේ ක්‍රියාකාරීත්වය සඳහා අත්‍යවශ්‍ය වන්නේ නම් එය පරිගණක උපකරණයේ කොටසක් වශයෙන් ප්‍රාග්ධනිත කරනු ලැබේ.

දේපළ , පිරියත සහ උපකරණ යටතේ වන අයිතමයක කොටසක් සතුව විවිධ ඵලදායී ජීව කාල පවතින විට ඒවා දේපළ, පිරියත සහ උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන සංරචක) වශයෙන් හඳුනුවනු ලැබේ.

ආයතනය විසින් දේපළ, පිරියත සහ උපකරණ ආකෘතිකරණය සඳහා වන පිරිවැය සහ මිලදී ගැනීමේ හෝ ඉදිකිරීමේ පිරිවැය පිළිබඳ වාර්තා සහ අඩු සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ සඳහා වන ඕනෑම අනුශංගික වියදම් අදාළ කරගනු ලැබේ.

3.1.3 පසුකාලීන පිරිවැය

දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක කොටසක් තුළ ගැබ්ව ඇති අනාගත ආර්ථික ප්‍රතිලාභ සමූහය තුළට ගලා ඒමේ හැකියාවක් පවතින්නේ නම් හා එහි පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි නම්, එබඳු කොටසක ප්‍රතිස්ථාපන පිරිවැය එම අයිතමයෙහි ධාරණ අගයට හඳුනා ගැනේ. දේපළ, පිරියත සහ උපකරණ දෛනිකව සේවාකිරීම සඳහා වැය වන පිරිවැය, එය වැය වන අකාරයට ලාභ හෝ අලාභ වශයෙන් ප්‍රකාශයට ඇතුළත් කරනු ලැබේ.

3.1.4 අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු

අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා කෙරෙන වැය එම වැය දරන ලද මූල්‍ය කාල පරිච්ඡේදයටම අදාළව ලාභ හෝ අලාභ ප්‍රකාශයෙන් අය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණ සඳහා වන පිරිවැය වත්කම්වල ධාරණ අගයට ඇතුළත් කරනු ලබන අතර අතිරේක වශයෙන් ඇති වත්කම් වලින් ආසන්නතම කාලයේ දී හඳුනාගනු ලබන කොටසක් අනාගත ආර්ථික ප්‍රතිලාභ වශයෙන් ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රතිසංස්කරණ සඳහා අදාළ වත්කම්වල ඉතිරි ඵලදායී ජීව කාලයේ දී ක්ෂය කරනු ලැබේ.

3.1.5 හඳුනාගැනීම බැහැර කිරීම

දේපළ, පිරියත සහ උපකරණ බැහැර කරන්නේ නම් හෝ අනාගත ප්‍රතිලාභ අපේක්ෂා කළ නොහැකි නම් ඒවා හඳුනාගැනීමෙන් වැළකී සිටිනු ලැබේ. වත්කම් හඳුනාගැනීම බැහැර කිරීමෙන් ඇතිවන ඕනෑම ලාභ හෝ අලාභ (ශුද්ධ බැහැර කිරීමේ ලාභ සහ වත්කම් වල ධාරණ අගය අතර වෙනස වශයෙන් ගණනය කර) අදාළ වර්ෂයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" වශයෙන් ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

3.1.6 ක්ෂය කිරීම්

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයන්හි සෑම කොටසකම ඇස්තමේන්තුගත ජීව කාලය අනුව සරල රේඛීය පදනම අනුව ක්ෂය වීම ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගනු ලබන අතර මෙම ක්‍රමය භාවිතා කරනුයේ වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පාරිභෝගික රටාව මෙමඟින් සමීප වශයෙන් පිළිබිඹු කරන බැවිනි.

ඇස්තමේන්තුගත ඵලදායී ජීව කාලය පහත පරිදි වේ;

ගොඩනැගිලි සහ සවිකිරීම්	අවුරුදු 40
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	අවුරුදු 05
කාර්යාල උපකරණ	අවුරුදු 05
පරිගණක සහ උපාංග	අවුරුදු 04
මෝටර් වාහන	අවුරුදු 05

දේපළ, පිරියත සහ උපකරණ යන අයිතමයන්හි සෑම සුවිශේෂී කොටසක් සඳහා ම ක්ෂය වීමේ අනුපාතය ඒවා භාවිතය සඳහා පවතින කාලයේ දී තීරණය කරනු ලැබේ. එනම් කළමනාකාරිත්වය විසින් අපේක්ෂා කරනු ලබන ආකාරයේ ක්‍රියාකාරී තත්ත්වයෙන් අදාළ ස්ථානයේ තිබීම. ක්ෂ වීමේ ක්‍රමවේදයන්, ඵලදායී ජීව කාලයන් සහ අවශේෂ අගයන් සෑම වාර්තා කරන දිනටම සමාලෝචනය කර යෝග්‍ය පරිදි ගැළපීම් කරනු ලැබේ.

3.1.7 අස්පෘශ්‍ය වත්කම්

ගිණුම්කරණ ප්‍රතිපත්තිය

වත්කමට ආරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ අරමුදල තුළට ගලා ඒමේ සම්භාවිතාවක් පවතී නම් හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මිනුම්කරණය කළ හැකි වේ නම් එය අස්පෘශ්‍ය වත්කමක් ලෙස හඳුනා ගැනේ. අස්පෘශ්‍ය වත්කමක් මුල් අවස්ථාවේ දී එහි පිරිවැයට මිනුම්කරණය කරනු ලැබේ. ව්‍යාපාර සංයෝජනයක දී අත්පත් කරගත් අස්පෘශ්‍ය වත්කම්වල පිරිවැය යනු අත්පත් කරගන්නා දිනයේ සාධාරණ අගයයි. මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, අස්පෘශ්‍ය වත්කම් සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර පිරිවැයට ධාරණය කෙරේ. අභ්‍යන්තරව ජනනය කළ අස්පෘශ්‍ය වත්කම් ප්‍රාග්ධනීකරණය කර නොමැති අතර ඒ හා සම්බන්ධිත වියදම්, වියදම් දැරූ වර්ෂයේ ම ලාභය හෝ අලාභය තුළ පිළිබිඹු කෙරේ.

පරිමිත ප්‍රයෝජනවත් ආයු කාලය සහිත අස්පෘශ්‍ය වත්කම්

පරිමිත ප්‍රයෝජනවත් ආයු කාලය සහිත අස්පෘශ්‍ය වත්කම් ඒවායේ ඵලදායි ජීව කාලය මුළුල්ලේ ක්‍රමක්ෂය කරන අතර අස්පෘශ්‍ය වත්කම හානිකරණය විය හැකි බවට ඇඟවීමක් ඇති සෑම අවස්ථාවක දීම හානිකරණය සඳහා තක්සේරු කරනු ලැබේ. පරිමිත ප්‍රයෝජනවත් ආයු කාලය සහිත අස්පෘශ්‍ය වත්කමක් සඳහා ක්‍රමක්ෂය කාලය හා ක්‍රමක්ෂය ක්‍රමවේදය සමාලෝචනය කිරීම අවම වශයෙන් සෑම මූල්‍ය වර්ෂයකම අවසානයේ සිදු කෙරේ. වත්කම්වල අන්තර්ගත වී ඇති අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයු කාලයේ හෝ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්හි අපේක්ෂිත පාරිභෝජන රටාවේ වෙනස් කම් යෝග්‍ය පරිදි ක්‍රමක්ෂය කාලය හෝ ක්‍රමක්ෂය ක්‍රමවේදය වෙනස් කිරීම ඔස්සේ වාර්තා කරන අතර එය ඒවා ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් ලෙස සලකනු ලැබේ. පරිමිත ප්‍රයෝජනවත් ආයු කාලය සහිත අස්පෘශ්‍ය වත්කම්හි ක්‍රමක්ෂය පිරිවැය ආදායම් ප්‍රකාශයේ වියදම් කාණ්ඩය තුළ අස්පෘශ්‍ය වත්කමක කාර්යයට අනුකූලව හඳුනා ගනු ලැබේ.

අස්පෘශ්‍ය වත්කම් සඳහා ඇස්තමේන්තුගත ඵලදායි ආයු කාලයන් පහත පරිදි වේ:

අයිතමය	**ඵලදායි ජීව කාලය**
පරිගණක මෘදුකාංග	අවුරුදු 05
වෙබ් අඩවිය	අවුරුදු 05

හඳුනාගැනීම් බැහැර කිරීම

අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමේ දී හෝ එහි භාවිතය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට අස්පෘශ්‍ය වත්කමක ධාරණ අගය බැහැර කරනු ලැබේ. අස්පෘශ්‍ය වත්කමක් බැහැර කිරීමේ දී පැන නඟින ලාභය හෝ අලාභය ගණනය කරනු ලබන්නේ ශුද්ධ බැහැර කිරීම් ලාභ හා බැහැර කරන දිනට එකී වත්කමේ ධාරණ අගය අතර වෙනස සැලකීමෙනි. වත්කම හඳුනාගැනීම බැහැර කරන අවස්ථාවේ දී ලාභ හෝ අලාභ ප්‍රකාශය තුළ එය හඳුනාගැනේ.

3.2 ආයෝජන දේපළ

3.2.1 හඳුනාගැනීමේ පදනම හා මිනුම්කරණය

කුලී ආදායම ඉපැයීම හෝ ප්‍රාග්ධන අගය වැඩිවීම හෝ මෙම කරුණු ද්විත්වය වෙනුවෙන්ම දරා සිටින, එනමුත් සාමාන්‍ය ව්‍යාපාර කටයුතු තුළ දී විකිණීම සඳහා නොපවතින දේපළ ආයෝජන දේපළ වේ. මෙම දේපළ භාණ්ඩ හා සේවා නිපදවීම හෝ සැපයුම සඳහා හෝ පරිපාලන කාර්යයන් වෙනුවෙන් භාවිතා කෙරේ.

ආයෝජන දේපළ මුල් අවස්ථාවේ දී එහි පිරිවැයට මිනුම්කරණය කෙරේ. මුල් හඳුනාගැනීමෙන් අනතුරුව, ආයෝජන දේපළ එහි පිරිවැය මත සඳහන් කෙරේ.

3.2.2 හඳුනාගැනීම් බැහැර කිරීම

ආයෝජන දේපළ බැහැර කිරීම හෝ ආයෝජන දේපළ ස්ථිරවම භාවිතයෙන් ඉවත් කිරීම සහ එසේ බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් අපේක්ෂා නොකරන විට ආයෝජන දේපළ හඳුනා ගැනීම් බැහැර කරනු ලැබේ. ආයෝජන දේපළක් විශ්‍රාම ගැන්වීම් හෝ ඉවත් කිරීම හේතුවෙන් ඇතිවන යම් ලාභයක් හෝ පාඩුවක් එකී විශ්‍රාම ගැන්වීම හෝ ආයෝජන දේපළක් ඉවත් කිරීම සිදුකළ වර්ෂයේම ලාභ හෝ අලාභ ප්‍රකාශයේ හඳුනාගැනේ.

3.2.3 ආයෝජන දේපළකට/ආයෝජන දේපළකින් පසුකාලීනව සිදුකරන මාරු කිරීම්

හිමිකරුගේ පදිංචිය අවසන් කිරීම, වෙනත් පාර්ශවයක් වෙත ක්‍රියාත්මක බද්දක් ආරම්භ වීම හෝ ඉදිකිරීමක් හෝ සංවර්ධනය කිරීමක් නිම වීම වැනි සාක්ෂි මඟින් භාවිතයෙහි වෙනස් වීමක් සිදුවුවහොත් පමණක් ආයෝජන දේපළකට මාරු කිරීම් සිදුකරනු ලැබේ.

හිමිකරුගේ පදිංචිය ආරම්භ කිරීම හෝ අලෙවි කිරීමේ පරමාර්ථයෙන් සංවර්ධනය කිරීම් ආරම්භ කිරීම වැනි සාක්ෂි මඟින් භාවිතයෙහි වෙනස් වීමක් සිදුවුවහොත් පමණක් ආයෝජන දේපළකින් මාරු කිරීම් සිදුකරනු ලැබේ.

ආයෝජන දේපළකින් හිමිකරු පදිංචිගත දේපළකට හෝ තොගයකට මාරු කිරීමේ දී, පසුකාලීන ගිණුම්කරණ කාර්යයන් සඳහා සැලකිය යුතු එහි දේපළ පිරිවැය වනුයේ භාවිතයෙහි වෙනස් වීමක් සිදු වූ දිනයේ එහි සාධාරණ අගය වේ. හිමිකරු විසින් පදිංචිගත දේපළක් ආකාරයෙන් දේපළ සමාගම විසින් පරිහරණය කරන්නේ නම් එය ආයෝජන දේපළක් වන අතර, එහි භාවිතයේ වෙනසක් සිදුවන දිනය දක්වාම දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව එකී දේපළ සඳහා සමාගම වගකිව යුතු වේ.

තොගයක් ආයෝජන දේපළක් බවට මාරු කිරීමේ දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ. සමාගම විසින් ඉදි කරන ලද ආයෝජන දේපළක, ඉදි කිරීම හෝ සංවර්ධනය කිරීම සමාගම විසින් නිමකරනු ලබන විට දී, දේපළෙහි සාධාරණ අගය අනුව අදාළ දිනයේ හා එහි පූර්ව ධාරණ අගයේ පවතින වෙනස ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දී හඳුනාගනු ලැබේ.

3.2.4 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

වත්කමක් හානිකරණය පිළිබඳ හැඟවීමක් ඇති ද යන්න සෑම වාර්තාකරණ දිනයකදී ම මහපොළ භාර අරමුදල විසින් තක්සේරු කරයි. කිසියම් හැඟවීමක් ඇත්නම්, හෝ වත්කමක් වෙනුවෙන් වාර්ෂික හානිකරණ පරීක්ෂාව අවශ්‍ය වන්නේ නම්, අරමුදල විසින් වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක (CGU) විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය සහ එහි භාවිත අගය යන දෙකෙන් වඩාත් වැඩි අගය වත්කමක නැවත අයකර ගත හැකි වටිනාකම වේ. වත්කමක් විසින් මුදල් ප්‍රවාහ ජනනය නොකරන අවස්ථාවන්හිදී මෙය තනි වත්කමක් සඳහා නිර්ණය කරන අතර අනෙකුත් වත්කම් හෝ වත්කම් කාණ්ඩ වලින් බොහෝ දුරට ස්වාධීන වේ. වත්කමක හෝ මුදල් ජනන ඒකකයක ධාරණ අගය එහි නැවත අයකර ගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවක, වත්කම් හානිකරණ වූ ලෙස සැලකෙන අතර එකී වත්කම එහි නැවත අයකරගත හැකි අගයට සටහන් කරනු ලැබේ. භාවිත අගය තක්සේරු කිරීමේ දී මුදලේ කාල අගය සහ වත්කමට සුවිශේෂී වූ අවදානම් වල ප්‍රවර්තන වෙළඳ පොල තක්සේරු පිළිබිඹු කරන බදුවලට පෙර වට්ටම් අනුපාතිකයක් භාවිතා කරමින් ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. විකුණුම් පිරිවැය අඩුකළ සාධාරණ අගය නිර්ණය කිරීමේ දී, ආසන්නතම වෙළඳපොල ගනුදෙනු තිබේ නම් ඒවා සැලකිල්ලට ගනු ලැබේ. එවැනි ගනුදෙනු හඳුනාගැනීමට නොහැකි නම්, යෝග්‍ය ආගණන ආකෘතියක් යොදා ගනු ලැබේ.

3.3. පරිපාලිතයන්හි ආයෝජන හා අනෙකුත් ආයෝජන

පරිපාලිතයන්හි සිදුකරන අයෝජන හා අනෙකුත් ආයෝජන මුල් අවස්ථාවේ දී සමාගමේ මූල්‍ය ප්‍රකාශ වල දී පිරිවැයක් ලෙස හඳුනා ගැනේ. පරිපාලිතයන් අත්පත් කරගැනීමට අදාළ යම් ගනුදෙනු පිරිවැයක් එම අවස්ථාවේදීම ආදායම් ප්‍රකාශයේ හඳුනාගන්නා අතර, පරිපාලිතයන්හි සිදුකරන අයෝජන මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව සමුච්චිත හානිකරණ පාඩු අඩු කිරීමෙන් පසු පිරිවැය මත දක්වනු ලැබේ.

3.4 විදේශීය මුදල්

අ) ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකය

මෙම අරමුදලේ මූල්‍ය ප්‍රකාශවල අන්තර්ගත අයිතමයන් මෙම අස්තිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකයෙන් (ව්‍යවහාරික මුදල් ඒකකය) මිනුම්ගත කරනු ලැබේ. මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය සමාගමේ ව්‍යවහාරික හා ඉදිරිපත් කෙරෙන මුදල් ඒකකයයි.

ආ) ගනුදෙනු හා ශේෂ

විදේශ මුදල් ඒකක වලින් සිදුවන ගනුදෙනු, අදාළ ගනුදෙනු සිදුවන දිනයන්හි දී බල පැවැත්වෙන විනිමය අනුපාතිකයන් භාවිතයෙන් ව්‍යවහාරික මුදල් ඒකකය වෙත පරිවර්තය කරනු ලැබේ. එවැනි ගනුදෙනු පියවීමේ දී සහ විදේශ ව්‍යාවහාර මුදල් ඒකක වලින් සිදුකරන මුදල් වත්කම් හා බැරකම් ගනුදෙනුවල දී ප්‍රතිඵල වන විදේශ විනිමය ලාභ සහ පාඩු විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ. මුදල් වත්කම් හා බැරකම් ශේෂ වසර අවසාන විනිමය අනුපාතිකය අනුව පරිවර්තනය කරනු ලැබේ.

3.5 බදුකරණය

3.5.1 ප්‍රවර්තන බදුකරණය

ප්‍රවර්තන හා පූර්ව කාල පරිච්ඡේද සඳහා ප්‍රවර්තන ආදායම් බදු වත්කම් හා වගකීම් ගණනය කරනු ලබන්නේ ආදායම් බදු කොමසාරිස්වරයා වෙතින් ලැබිය යුතු හෝ එම දෙපාර්තමේන්තුව වෙත ගෙවිය යුතු මුදල් ප්‍රමාණය වශයෙනි. මෙම ප්‍රමාණයන් ගණනය සඳහා යොදා ගැනෙනුයේ වාර්තාකරණ දිනයට පෙර සිට බල පැවැත් වූ හෝ එම දිනයට බල පැවැත්වෙන පරිදි පනවා ඇති බදු අනුපාතික හා බදු නීති වේ.

මෙම භාර අරමුදල සඳහා ආදායම් බදු ප්‍රතිපාදන පදනම පහත පරිදි වේ;

අ) **මහපොළ භාර අරමුදල**

මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ආදායම් බදු ගෙවීමට යටත් වන අතර අවසාන ගෙවිය යුතු බදු මුදල ගණනය කරනුයේ අදාළ කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ආදායම මත වන අතර, බදු ගණනය සඳහා අවසාන ආදායම නිර්ණය කිරීමේ දී සියලුම වියදම් අවසර දී ඇති වියදම් ලෙස සැලකේ.

ආ) මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදලේ ආදායම් බදු සම්බන්ධයෙන් ලැබී ඇති අමාත්‍ය මණ්ඩල තීරණය

අමාත්‍ය මණ්ඩල සංදේශ- ප්‍රතිපත්තිමය කරුණු

1981 අංක 66 දරන මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල් පනතේ 12 වන වගන්තිය යටතේ දක්වා ඇති පරිදි ආනයන තීරුබදු, ආදායම් බදු හා ත්‍යාග බදු, රදවාගැනීමේ බදු ඇතුලුව සියලුම බදු වලින් නිදහස් වීම සඳහා එකී අරමුදල 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 3වන උපලේඛනය 09වන වගන්තිය යටතේ ඇතුළත් කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කළ 2019.12.31 දිනැති අංක 20/0144/215/010 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය - මෙම අමාත්‍ය මණ්ඩල සංදේශය මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යවරරයාගේ නිරීක්ෂණ සමඟ සලකා බලන ලදී. සාකච්ඡාවෙන් අනතුරුව මෙම අමාත්‍ය මණ්ඩල සංදේශයේ දක්වා ඇති කාර්යය සඳහා මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන ලේකම් සමඟ සහයෝගයෙන් ඊළඟ අයවැය සඳහා යෝජනාවක් ඉදිරිපත් කිරීමට ඇති හැකියාව සොයා බැලීමට උසස් අධ්‍යාපන, තාක්ෂණ හා නවෝත්පාදන අමාත්‍යාංශ ලේකම් වෙත යොමු කිරීමටත් ඒ අනුව ඉදිරි කටයුතු සිදු කිරීමටත් තීරණය විය.

3.5. 2 විලම්බිත බදු

වාර්තාකරණ දිනට වත්කම් හා බැරකම්වල බදු පදනම් හා මූල්‍ය වාර්තාකරණ කාර්යයන් වෙනුවෙන් ඒවායේ ධාරණ අගයන් අතර තාවකාලික වෙනස මත බැරකම් ක්‍රමය භාවිතා කරමින් විලම්බිත බදු ඉදිරිපත් කෙරේ.

බදු අයකළ හැකි සියලු තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු බැරකම් හඳුනාගනු ලැබේ.

සියලු අඩු කළ හැකි තාවකාලික වෙනස්කම් වෙනුවෙන් විලම්බිත බදු වත්කම් හඳුනාගනු ලබන අතර, භාවිතා නොකළ බදු ණය හා බදු අලාභ වල අඩු කළ හැකි තාවකාලික වෙනස සහ ඉදිරියට ගෙන යෑම උපයෝජනය කිරීම සඳහා යොදා ගැනීමට බදු අය කළ හැකි ලාභ පැවතීමේ සම්භාවිතාව පවතින තෙක් දුරට භාවිතා නොකළ බදු ණය හා බදු අලාභ ඉදිරියට ගෙන යෑමේ හැකියාව ඇත.

3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ලෙස ඇතුළත් වනුයේ අතැති හා බැංකුවේ ඇති මුදල්, අත්පත් කරගන්නා දිනයේ සිට මාස තුනක් හෝ ඊට අඩු කාල සීමාවක් තුළ මුල් කල් පිරීමේ දිනය සහිත ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු අනෙකුත් කෙටි කාලීන ආයෝජන වේ. බැංකු අයිරා පහසුකම් ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දැක්වේ.

4 මූල්‍ය උපකරණ - මුල් වරට හඳුනා ගැනීම හා පසුව සිදුවන මිනුම්කරණයන්

4.1 මූල්‍ය වත්කම්

4.1.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා මිනුම්කරණය

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, වත්කම් කළමනාකරණය සඳහා වූ ව්‍යාපාරික අකෘතිය මත පදනම්ව මහපොළ භාර අරමුදල විසින් එහි සියලු මූල්‍ය වත්කම් වර්ගීකරණය පහත සඳහන් ආකාර වලින් එකකට සිදුකරනු ලැබේ

- ක්‍රමක්ෂය පිරිවැය
- වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI)
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL)

මූල්‍ය වත්කම්වල පසුව සිදුවන මිනුම්කරණයන් ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

4.1.2 ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමක් පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන්නේ නම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL) මත නම් නොකරන්නේ නම්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව එම මූල්‍ය වත්කම ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කෙරේ:

- මූල්‍ය වත්කම රඳවා ගැනීම මඟින් ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම අරමුණු කරගත් ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම දරා සිටින විට; සහ

- හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධනය මත පොළී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් යම් නිශ්චිත දිනයක දී පැන නඟින මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි.

4.1.3 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට (FVOCI) මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම් ලෙස වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ණය හා ස්කන්ධ උපකරණ ඇතුළත් වේ.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට මිනුම්කරණය කරන ලද ණය උපකරණ සහ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද ස්කන්ධ උපකරණ වලින් මෙය සමන්විත වේ.

4.1.4 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය උපකරණ

ණය උපකරණයක් පහත දැක්වෙන කොන්දේසි ද්විත්වයම සපුරාලන්නේ නම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය (FVTPL) මත නම් නොකරන්නේ නම්, එම ණය උපකරණය වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව මිනුම්කරණය කෙරේ:

- ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම හා මූල්‍ය වත්කම් විකිණීම මඟින් සිය අරමුණු ඉටු කර ගනු ලබන ව්‍යාපාර ආකෘතියක් තුළ වත්කම දරා සිටින විට; සහ

- හුදෙක් ප්‍රාග්ධනය වෙනුවෙන් හා හිඟ ප්‍රාග්ධනය මත පොළී ගෙවීම ආකාරයේ මුදල් ප්‍රවාහයන් යම් නිශ්චිත දිනයක දී පැන නඟින මූල්‍ය වත්කම්වල ගිවිසුම්ගත කොන්දේසි.

වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව පවතින ණය උපකරණ, වෙනත් විස්තීර්ණ ආදායම්හි හඳුනාගනු ලබන සාධාරණ අගය වෙනස් වීමෙන් පැන නඟින ලාභ හෝ අලාභ සමඟින් පසුව සාධාරණ අගය අනුව මිනුම්කරණය කෙරේ. පොලී ආදායම සහ අපේක්ෂිත බැරකම් අලාභ සහ ප්‍රතිවර්තනයන් ලාභ අලාභ තුළ හඳුනාගැනේ. පෙර වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගනු ලැබූ සමුච්චිත ලාභ හෝ අලාභ හඳුනාගැනීම් බැහැර කිරීමේ දී, වෙනත් විස්තීර්ණ ආදායම් වලින් ලාභ අලාභ වෙත ප්‍රතිවර්ගීකරණය කෙරේ. මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) යටතේ විකිණීම සඳහා පවතින වශයෙන් වර්ගීකරණය කර තිබූ රජයේ සුරැකුම්පත්වලින් මෙම උපකරණ සමන්විත වේ.

4.1.5 වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව ස්කන්ධ උපකරණ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 32 (LKAS 32)හි "මූල්‍ය සාධනපත්‍ර: ඉදිරිපත් කිරීම" යටතේ ස්කන්ධය යන්නෙහි අර්ථ දැක්වීමට අනුකූල වන සහ වෙළඳාම සඳහා රඳවා නොගත් ස්කන්ධ උපකරණවලින් ක්‍රමෝපායික කාර්යය සඳහා රඳවාගත් ස්කන්ධ ආයෝජන වලින් කොටසක් මුල් හඳුනාගැනීමෙන් පසු, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය (FVOCI) අනුව ණය උපකරණ ලෙස අවලංගු කර ගත නොහැකි පරිදි වර්ගීකරණය කිරීමට සමාගම විසින් ඇතැම්විට තීරණය කරනු ලැබේ. එවැනි වර්ගීකරණයක් උපකරණයෙන් උපකරණයට යන පදනම මත නිගමනය වේ.

මෙම ස්කන්ධ උපකරණවල ලාභ සහ අලාභ කිසිදුවිටක ලාභ හෝ අලාභ යටතට ප්‍රතිවක්‍රණය නොවන අතර, ඒ වෙනුවට එකී හඳුනාගැනීම් බැහැර කරන අවස්ථාවේ දී රඳවාගත් ඉපැයුම් වෙත සෘජුවම මාරු කෙරේ. ගෙවීම් වෙත අයිතිය ස්ථාපනය වූ පසු, ලාභාංශ ලාභ හෝ අලාභ ලෙස අනෙකුත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනාගැනේ. වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වන ණය උපකරණ හානිකරණ පරීක්ෂාවට භාජනය නොවේ.

මීට පෙර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39)හි "විකිණීම සඳහා පවතින" යටතේ වර්ගීකරණය වූ මිල සඳහන් නොකළ හිමිකම් කොටස් වලින් මෙම උපකරණ සමන්විත වේ.

4.1.6 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මිනුම්කරණය කරන ලද මූල්‍ය වත්කම්

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව වර්ගීකරණය වූ මූල්‍ය වත්කම් හැර අනෙකුත් සියලුම මූල්‍ය වත්කම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට මිනුම්ගත මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කෙරේ. වෙළඳාම සඳහා රඳවා ගත් හෝ කළමනාකරණය කරන හා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා දරා නොසිටින මෙන්ම මුදල් ප්‍රවාහ එක්රැස් කිරීම සඳහා සහ මූල්‍ය වත්කම් විකිණීම යන කාර්ය ද්විත්වය වෙනුවෙන්ම දරා නොසිටින බැවින් එහි කාර්යසාධනය සාධාරණ අගය මත පදනම්ව ඇගයීම සිදුවන මූල්‍ය වත්කම් ද සහ මුල් හඳුනාගැනීමෙන් පසු ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ද ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වේ.

ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය වත්කම් යටතට ඇතුළත් වනුයේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) අනුව, වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය වත්කම් හා ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ලද මූල්‍ය වත්කම් ය.

4.2 මූල්‍ය බැරකම්

4.2.1 මූල්‍ය බැරකම් වර්ගීකරණය හා පසුකාලීන මිනුම්කරණය

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) අනුව, මූල්‍ය බැරකම් පහත ආකාරයෙන් වර්ගීකරණය කෙරේ.

- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්, සහ
- වෙළඳාම සඳහා රඳවා ගත් හෝ
- ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගයට නම් කරන ලද වශයෙන් මෙම කාණ්ඩය තුළ වර්ගීකරණය වේ.
- ක්‍රමක්ෂය පිරිවැය අනුව මිනුම්කරණය කළ මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකම්වල පසුකාලීන මිනුම්කරණය ඒවායේ වර්ගීකරණය මත රඳා පවතී.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) මඟින් මූල්‍ය බැරකම් වර්ගීකරණය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 (LKAS 39) හි පවතින අවශ්‍යතා බොහෝ සෙයින් රඳවා ගෙන ඇත.

4.2.2 ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම්

වෙළඳාම සඳහා රඳවා ගත් මූල්‍ය බැරකම් සහ ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මුල් හඳුනාගැනීමෙන් අනතුරුව නම් කරන ලද මූල්‍ය වගකීම් ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව මූල්‍ය බැරකම් යටතට ඇතුළත් වේ. ලාභ හෝ අලාභ ඔස්සේ සාධාරණ අගය අනුව නම් නොකෙරන මූල්‍ය බැරකම් ක්‍රමක්ෂය පිරිවැය අනුව මූල්‍ය බැරකම් ලෙස වර්ගීකරණය කෙරේ.

4.3 මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් හඳුනාගැනීම බැහැර කිරීම

4.3.1 මූල්‍ය වත්කම්

මූල්‍ය වත්කමකින් ජනනය වන මුදල් ප්‍රවාහයන් සඳහා ඇති ගිවිසුම්ගත අයිතිය අවසන් වෙන විට හෝ ගනුදෙනුවකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති අයිතිය පැවරීමේ දී මූල්‍ය වත්කමෙහි අයිතිය හා සම්බන්ධිත සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ සමාගම විසින් පවරා ඇති විට හෝ නැතහොත් මූල්‍ය වත්කමෙහි අයිතිය හා සම්බන්ධිත සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ සමාගම විසින් පැවරීම හෝ රඳවා ගනීම සිදු නොකරන විට සහ සමාගම විසින් මූල්‍ය වත්කමක පාලනය රඳවා ගැනීම සිදුනොකරන විට යන අවස්ථාවල දී සමාගම විසින් එම මූල්‍ය වත්කමෙහි (හෝ අදාළ වන පරිදි එහි කොටසක හෝ) හඳුනාගැනීම බැහැර කරනු ඇත.

වත්කමෙහි ධාරණ අගය (හෝ වත්කමෙහි හඳුනාගැනීම බැහැර කරන කොටසට අදාළ වන ධාරණ අගය) හා ලැබී ඇති ප්‍රතිශ්ඨාවල එකතුව (අලුතින් එක් කරගත් නව වත්කම්වලින් අලුතින් භාර ගන්නා බැරකම් අඩුකර එයද ඇතුළුව) අතර වෙනස සහ වෙනත් විස්තීර්ණ ආදායම්හි දී හඳුනාගන්නා යම් සමුච්චිත ලාභ/අලාභ, මූල්‍ය වත්කමක හඳුනාගැනීම බැහැර කිරීමේ දී ලාභ හෝ අලාභ වල දී හඳුනා ගැනේ.

එසේ වුව ද, වෙනත් විස්තීර්ණ ආදායම් ඔස්සේ සාධාරණ අගය අනුව නම් කරන ස්කන්ධ ආයෝජන සුරැකුම් වලට අදාළව වෙනත් විස්තීර්ණ ආදායම්හි දී

හඳුනාගන්නා සමුච්චිත ලාභ/අලාභ, එවැනි සුරැකුම්වල හඳුනාගැනීම බැහැර කිරීමේ දී ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 9 (SLFRS 9) ට අනුකූලව ලාභ හෝ අලාභ වල දී හඳුනා නො ගැනේ.

සමාගම විසින් නිර්මාණය කරනු ලබන හෝ රඳවා ගෙන සිටින, හඳුනාගැනීම බැහැර කිරීම සඳහා සුදුසුකම් ලබන පැවරූ මූල්‍ය වත්කමකට අදාළ කවර හෝ හිමිකමක් ඇතොත් එය වෙනම වත්කමක් හෝ බැරකමක් වශයෙන් හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ හඳුනාගනු ලබන වත්කම් මාරු කිරීම සඳහා සමාගම ගනුදෙනු වලට එළඹීම සිදු කරන මුත් මාරු කරනු ලබන වත්කම්හි හෝ එහි කොටසක සියලු හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීම සිදු කරයි. එවැනි අවස්ථාවන්හි දී, මාරු කරනු ලබන වත්කම්වල හඳුනාගැනීම බැහැර කිරීම සිදු කරනු නොලැබේ.

වත්කම් තෙවන පාර්ශවයක් වෙත, මාරු කරනු ලබන වත්කම්හි සමකාලීන මුළු ඉපැයුම් අනුපාතිකය හුවමාරු වන පරිදි විකිණීම සිදු කරන විට දී, එය අලෙවි හා ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනුවක් හා සමානව සුරැකුම් කරන ලද මූල්‍යමය ගනුදෙනුවක් ලෙස ගිණුම්ගත කෙරේ. මීට හේතුව සමාගම විසින් එකී වත්කම් වල හිමිකාරිත්වයේ සියලුම හෝ සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගැනීමයි.

සමාගම විසින් වත්කමකින් මුදල් ප්‍රවාහයක් ලැබීමට ඇති සිය අයිතිය පැවරූ විට හෝ පැවරීමේ විධිවිධානයකට එළඹී සිටීම සහ වත්කමක සැලකිය යුතු සියලු අවදානම් හා ප්‍රතිලාභ පැවරීමක් හෝ රඳවා ගැනීමක් හෝ සිදුකර නොමැති හෝ වත්කම පාලනය කිරීම පවරා නොමැති විටක, වත්කම සම්බන්ධයෙන් සමාගමේ අඛණ්ඩ සම්බන්ධතාවය පවතින සීමාව දක්වා එම වත්කම හඳුනාගැනීම සිදු කෙරේ. එම අවස්ථාවේ දී සමාගම විසින් ආශ්‍රිත බැරකම් හඳුනාගනු ලැබේ. සමාගම විසින් රඳවාගනු ලබන අයිතීන් හා බැඳීම් පිළිබිඹු වීමේ පදනම මත පැවරූ වත්කම් හා ආශ්‍රිත වගකීම් මිනුම්කරණය කෙරේ.

4.3.2 මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකමක ගිවිසුම්ගත බැඳීම් ඉටු කළ විට හෝ අවලංගු වූ විට අදාළ කාලය අවසන් වූ විට, සමාගම විසින් මූල්‍ය බැරකම හඳුනාගැනීම බැහැර කරනු ලැබේ.

4.3.3 මූල්‍ය උපකරණ හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා මූල්‍ය බැරකම් හිලව්කර එකී ශුද්ධ වටිනාකම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි වාර්තා කරන්නේ හඳුනාගත් වටිනාකම් හිලව් කිරීම ප්‍රවර්තන ලෙස බල ගැන්විය හැකි නීතිමය අයිතියක් ඇත්තේ නම් පමණක්ම වන අතර, ශුද්ධ පදනමක් මත පියවීමට නැතහොත් උපලබ්ධි කර ගැනීමට හා සමගාමීව බැරකම් අවසන් කිරීමට අභිප්‍රායක් ඇත්තේ නම් පමණකි.

ආදායම් සහ වියදම් ශුද්ධ පදනම මත ඉදිරිපත් කරනුයේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මඟින් අවසර ලැබෙන අවස්ථාවන්හි දී පමණක්, හෝ සමාගමේ වෙළඳ කටයුතු වැනි සමාන ආකාරයේ ගනුදෙනු සමූහයකින් ප්‍රතිඵල වන ලාභ හා අලාභ සඳහා පමණි.

5. බැරකම් හා ප්‍රතිපාදන

5.1 බැරකම්

5.1.1 විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

5.1.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් - විශ්‍රාම පාරිතෝෂිකය

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සියලුම සේවකයන් සඳහා පළමු වසරේ සිටම ක්‍රියාත්මක වන විශ්‍රාම පාරිතෝෂිත සඳහා ප්‍රතිපාදන වෙන්කරනු ලැබේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂිත ගෙවීම් පනත යටතේ, සේවකයකු සඳහා වගකීමක් ඇති වනුයේ වසර 05ක සේවා කාලයක් සම්පූර්ණ වීමෙන් අනතුරුව වේ. මෙම වගකීම ගණනය කරනුයේ සෑම වර්ෂයක් සඳහා ම මාසයක වැටුපෙන් අර්ධයක අනුපාතිකය මත වේ. මෙම අයිතමය මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ සේවක ප්‍රතිලාභ බැරකම් යටතේ දැක්වේ.

මෙම පාරිතෝෂිත බැරකම් වෙනුවෙන් බාහිර ලෙස මුදල් යෙදවීමක් සිදු නොවේ.

5.1.3 නිශ්චිත දායකත්ව සැලසුම්- සේවක අර්ථසාධක අරමුදල සහ සේවක භාරකාර අරමුදල

මහපොළ භාර අරමුදල විසින් සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත දරන දායකත්වයන් අදාළ නීතිරීති වලට අනුකූලව අදාළ දායකත්ව ප්‍රතිපාදන මඟින් ආවරණය වේ. සේවකයන් ආවරණය කරමින් දායකත්ව සැලසුම් වෙත දායක මුදල් ගෙවීමට ඇති බැඳීම් ආදායම් ප්‍රකාශයේ වියදමක් වශයෙන් හඳුනාගනු ලැබේ.

සේවක අර්ථසාධක අරමුදල

භාරකාර අරමුදල හා සේවකයා විසින් පිළිවෙලින් සේවකයාගේ මාසික දළ වැටුපෙන් 15%ක් හා 10%ක් වශයෙන් සේවක අර්ථසාධක අරමුදලට දායකත්වය සපයනු ලැබේ.

සේවක භාරකාර අරමුදල

සේවක භාරකාර අරමුදලට සේවකයාගේ මාසික දළ වැටුපෙන් 3%ක දායකත්වයක් මහපොළ භාරකාර අරමුදල විසින් දරනු ලැබේ.

5.2 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන බැඳීමක් (නෛතික හෝ සම්මුතික) පවතින විට, එම බැඳීම් බේරුම් කිරීම සඳහා ආර්ථික ප්‍රතිලාභ ගැබ් වූ සම්පත් බැහැරට ගලා යෑමේ ඉඩකඩ පවතින විට, හා බැඳීම් ප්‍රමාණය පිළිබඳ විශ්වාසනීය ඇස්තමේන්තුවක් කළ හැකිවිට ප්‍රතිපාදන හඳුනාගැනේ. සමාගම විසින් ඇතැම් හෝ සියලු ප්‍රතිපාදන ප්‍රතිපූරණය කිරීමක් අපේක්ෂා කරන අවස්ථාවක දී, නිදසුනක් වශයෙන් රක්ෂණ කොන්ත්‍රාත්තුවක් යටතේ නම්, ප්‍රතිපූරණය වෙනම වත්කමක් යටතේ හඳුනාගන්නා අතර නමුත් එසේ කරනුයේ ප්‍රතිපූරණය සත්‍ය වශයෙන්ම ස්ථීර නම් පමණකි. කවර ආකාරයක

හෝ ප්‍රතිපාදනයක් හා සබැඳි වියදම්, යම් ප්‍රතිපූරණයක් තිබේ නම් එය අඩු කොට ආදායම් ප්‍රකාශය තුළ ඉදිරිපත් කෙරේ.

මුදලේ කාල අගයේ බලපෑම ප්‍රමාණාත්මක නම්, බැරකම් සඳහා නිශ්චිත වන අවදානම් අදාළ පරිදි පෙන්නුම් කෙරෙන ප්‍රවර්තන පෙර-බදු අනුපාතිකය භාවිතයෙන් ප්‍රතිපාදන වට්ටම් කරනු ලැබේ. වට්ටම් කිරීම යොදා ගනු ලබන විට කාලය ගත වීමට අනුව සිදුවන ප්‍රතිපාන වැඩිවීම මූල්‍ය පිරිවැයක් වශයෙන් හඳුනාගැනේ.

6. ආදායම් හා වියදම්

6.1 ආදායම් හඳුනාගැනීම

2018 ජනවාරි මස 01 වන දින සිට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මඟින්, ආදායම සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 18 (LKAS 18) හා ඉදිකිරීම් කොන්ත්‍රාත්තු සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 11 (LKAS 11) සහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ විවරණ කමිටුවේ පාරිභෝගික ලැදියාව සම්බන්ධ IFRIC 13 ද ඇතුළුව ආදායම් හඳුනාගැනීම් මාර්ගෝපදේශ ප්‍රතිස්ථාපනය කර ඇත.

ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත 15 (SLFRS 15) මඟින් ආදායම හඳුනාගනු ලබන්නේ කෙසේ ද හා කොපමණ වශයෙන් කවර දිනකට ද යන්න නිර්ණය කිරීම සඳහා සම්පූර්ණ ආකෘති රාමුවක් සපයනු ලැබේ. ආදායම හඳුනාගනු ලබන්නේ කවර දිනයකට ද හා කවර අගයකින් ද නිර්ණය කිරීම සඳහා අස්තිත්ව විසින් පියවර පහකින් යුතු ආකෘතියක් යොදා ගැනීම අවශ්‍ය වේ. ආදායම හඳුනා ගන්නේ කවර දිනයක ද හෝ අස්තිත්වය සඳහා අපේක්ෂා කරන හිමිකාරිත්වය යටතේ කුමන අගයකින් පාරිභෝගිකයා වෙත භාණ්ඩ හා සේවාවල පාලනය පවරා දීම යන්න සහ භාරකාර අරමුදල වෙත ආර්ථික ප්‍රතිලාභ ගලා ඒම අපේක්ෂා කළ හැක්කේ කවර දිනයක දී යන්න හා ගෙවීම් කරන දිනය කුමක් වුවද ආදායම හා දරන ලද හෝ දැරිය යුතු ආශ්‍රිත වියදම් විශ්වාසනීය ආකාරයකින් මිනුම්කරණය මෙම ආකෘතිය මඟින් නිශ්චය කෙරේ. ගිවිසුම්ගත නිශ්චිත ගෙවීම් කොන්දේසි ද සැලකිල්ලට ගෙන ලැබී ඇති හා ලැබිය යුතු ප්‍රතිශ්ඨාවන්ට අදාළ සාධාරණ අගය මත ආදායම් මිනුම්කරණය වේ.

6.1.1 පොලී ආදායම්

ක්‍රමක්ෂය කරන ලද පිරිවැය අනුව මිනුම්ගත සියලු මූල්‍ය උපකරණ හා විකිණීම සඳහා පවතින යටතේ වර්ගීකරණය කළ පොලී දරන මූල්‍යමය වත්කම් මත පොලී ආදායම හෝ වියදම් වාර්තා කරනුයේ සඵල පොලී අනුපාතිකය (EIR) මත වේ. සඵල පොලී අනුපාතිකය යනු මූල්‍ය වත්කමෙහි හෝ බැරකමෙහි ශුද්ධ ධාරණ අගයට මූල්‍ය උපකරණවල අපේක්ෂිත ජීව කාලය හෝ කෙටි කාල සීමාවක් ඔස්සේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගෙවීම් හෝ ලැබීම් අනුව තත්ත්වාකාරයෙන් වට්ටම් කරනු ලැබූ අනුපාතිකයයි. ආදායම් ප්‍රකාශයේ මූල්‍ය ආදායම් තුළ පොලී ආදායම ඇතුළත් වේ.

6.1.2 අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම යටතේ හඳුනාගැනේ.

6.2 වියදම්

ව්‍යාපාරය පවත්වාගෙන යාමට වැය කෙරෙන සියලු වියදම් වසර සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමෙන් අය කරනු ලැබේ. අලුත්වැඩියා කිරීම් හා අලුත් කිරීම් අදාළ වියදම දරනු ලැබූ වර්ෂයට අදාළ ලාභ හා අලාභ වලින් අය කරනු ලැබේ.

7	ආදායම	**2020**	**2019**
		රු.	රු.
	මහපොළ භාරකාර අරමුදලෙහි ආයෝජන ආදායම (උප සටහන 7.1)	1,255,366,340	1,150,242,194
	සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ලාභ කොටස	1,262,598,385	997,346,600
	ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් ලද බදු කුළී	25,000,000	20,000,000
		2,542,964,725	**2,167,588,794**

7.1	**මහපොළ භාරකාර අරමුදල - ආයෝජන ආදායම**	**2020**	**2019**
		Rs.	**Rs.**
	භණ්ඩාගාර බැඳුම්කර- කූපන්පත් උප සටහන 7.2)	579,451,161	621,446,796
	භාණ්ඩාගාර බඳුම්කර - මුදලෙහි ශුද්ධ ප්‍රාග්ධන ලාභ	173,237,794	50,165,824
	භාණ්ඩාගාර බිල්පත් - පොළී	238,865	6,270,403
	බැංකු වත්කම් ආදායම	-	32,401,919
	ණයකර පොළිය	205,311,963	171,570,098
	ස්ථාවර තැන්පතුවල ශුද්ධ පොළිය - රැඳවුම් බදු	287,876,625	253,265,898
	ප්‍රති මිලදී ගැනීම් ගිවිසුම	2,462,846	9,191,949
	හදිසි ආදායම්	6,552,749	5,683,277
	ස්වයංක්‍රීය මුදල් කළමනාකරණ ආදායම්	234,337	246,030
		1,255,366,340	**1,150,242,194**

7.2	**භාණ්ඩාගාර බැඳුම්කර කූපන් ආදායම**	**2020**	**2019**
		රු.	රු.
	භාණ්ඩාගාර බැඳුම්කර - කූපන්පත්	629,944,580	664,811,515
	අඩුකළා: භාණ්ඩාගාර බැඳුම්කර මුදල සහ වට්ටම්	(50,493,419)	(43,364,719)
		579,451,161	**621,446,796**

8 ඍජු වියදම්

ශිෂ්‍යත්ව ගෙවීම්	**2020** රු.	**2019** රු.
ශිෂත්ව ගෙවීම් විශ්වවිද්‍යාල (උප සටහන 8.1)	1,321,558,450	1,253,782,384
ශිෂත්ව ගෙවීම් -තාක්ෂණ විද්‍යාල	63,617,000	50,727,500
ශිෂත්ව ගෙවීම් - වෙනත් උසස් අධ්‍යාපන ආයතන	4,354,750	5,524,996
නව ශිෂත්ව ප්‍රදාන වියදම්	1,889,216	1,671,256
	1,391,419,416	**1,311,706,136**

8.1 ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල	**2020** **Rs.**	**2019** **Rs.**
ශිෂ්‍යත්ව ගෙවීම් - විශ්වවිද්‍යාල	2,583,971,250	2,197,988,134
අඩුකළා : භාණ්ඩාගාර දායකත්වය (වි.වි.කොා.ස මගින්)	(1,262,412,800)	(944,205,750)
	1,321,558,450	**1,253,782,384**

9 වෙනත් ආදායම්	**2020** රු.	**2019** රු.
කාර්ය මණ්ඩල ණය පොළිය	32,818	56,382
පරිත්‍යාග	-	15,000
ශිෂ්‍යත්ව අඩුකිරීම්	13,400	-
සුළු ආදායම්	6,422	6,345
	52,640	**77,727**

10	**පරිපාලන වියදම්**	**2020**	**2019**
		රු	රු
	වැටුප්	12,590,984	11,806,066
	පැමිණීමේ සහ සන්නිවේදන දීමනා	1,523,500	1,319,000
	අනිකාල සහ සති අන්ත දීමනා	490,483	685,260
	සේවක අර්ථසාධක අරමුදල	1,033,835	895,192
	සේවක භාරකාර අරමුදල	232,211	201,678
	ලබා නොගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම සහකාර්ය මණ්ඩල දිරිදීමනා	-	272,261
	ක්ෂයකිරීම්	30,589,616	29,715,489
	ක්‍රමක්ෂය	179,529	166,292
	තැපැල් සහ සන්නිවේදන	56,835	94,859
	පාරිතෝෂික	482,837	662,569
	ශුභසාධන වියදම්	157,664	195,806
	දුරකථන	567,465	509,044
	විගණන ගාස්තු	1,306,140	916,407
	භාෂා පරිවර්තන සහ වෙනත් සේවා ගාස්තු	402,513	614,639
	ගෙවීම්	464,944	325,104
	ඉන්ධන, ගමන් ගාස්තු සහ යැපීම් දීමනා	408,803	513,115
	ජලය	9,727	10,956
	විදුලිය	552,982	553,199
	පවිත්‍රතා වියදම්	43,100	64,600
	සංග්‍රහ වියදම්	60,226	70,775
	ආරක්ෂක ගාස්තු	336,160	310,000
	මුද්‍රණ සහ ලිපිලේඛන	910,953	737,940
	නඩත්තු වියදම් - කාර්යාල උපකරණ	320,479	128,459
	කාර්යාල බදු කුළී - ජේ.ආර්.ජයවර්ධන මධ්‍යස්ථානය	3,571,163	4,185,851
	පද්ධති නඩත්තුව සහ තොරතුරු තාක්ෂණ වියදම්	241,578	60,000
	පරිත්‍යාග - ලලිත් ඇතුලත්මුදලි පදනම	755,000	1,345,218
	කාර්ය මණ්ඩල සෞඛ්‍ය රක්ෂණය	328,750	262,499
	වෙළඳ දැන්වීම්	163,500	-
	නීති ගාස්තු	2,344,514	1,843,143
	දායකත්ව ගාස්තු	6,595	291,950
	සුළු වියදම්	76,412	137,439
	වෙබ් අඩවිය වැඩිදියුණු කිරීමේ පිරිවැය	-	285,500
	වාහන බදුකුළී	1,717,200	1,819,225
	වාහන නඩත්තුව	515,094	294,472
	භාරකාර ගාස්තු - ගංකා බැංකු ආයෝජන	3,507,388	1,672,194
	සෞඛ්‍ය සහ ආරක්ෂාව සම්බන්ධ විදම්	230,078	-
		66,178,257	**62,966,200**

11	**මූල්‍ය පිරිවැය**	**2020**	**2019**
		රු	රු
	බැංකු ගාස්තු	71,725	286,913
	ණය පොළී	-	36,734,476
		71,725	**37,021,388**

12 දේපළ, පිරියත සහ උපකරණ

12.1 දළ ධාරණ අගයන්

	2020.12.31 දිනට ශේෂය	එකතුකිරීම්	බැහැරකිරීම්	**2020.12.31.** දිනට ශේෂය
		රු.	රු.	
ගොඩනැඟිලි	1,064,520,695	-	-	1,064,520,695
ගෘහභාණ්ඩසහ සවිකිරීම්	7,935,353	-	-	7,935,353
කාර්යාල උපකරණ	1,511,085	103,350	-	1,614,435
පරිගණක සහ උපාංග	6,896,830	274,500	-	7,171,330
මෝටර් වාහන	16,190,000	-	-	16,190,000
ක්ෂය කළහැකි වත්කම් වල මුළු වටිනාකම	**1,097,053,963**	**377,850**	**-**	**1,097,431,813**

12.2 සමුච්චිත ක්‍රමක්ෂය සහ අපචය වත්කම්

	2020.12.31 දිනට ශේෂය	ගාස්තු	බැහැරකිරීම්	**2020.12.31** දිනට ශේෂය
	රු.	රු.	රු	රු.
ගොඩනැඟිලි	184,133,310	24,455,205	-	208,588,515
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	4,522,678	1,432,976	-	5,955,654
කාර්යාල උපකරණ	840,203	277,776	-	1,117,979
පරිගණක සහ උපාංග	4,589,123	1,185,659	-	5,774,782
මෝටර් වාහන	2,368,619	3,238,000	-	5,606,619
මුළු ක්ෂකිරීම්	**196,453,933**	**30,589,616**	**-**	**227,043,550**

12.3 ශුද්ධ පොත් අගය

	2020	**2019**
	රු.	රු.
ගොඩනැඟිලි	855,932,180	880,387,385
ගෘහභාණ්ඩ සහ සවිකිරීම්	1,979,699	3,412,675
කාර්යාල උපකරණ	496,456	670,882
පරිගණක සහ උපාංග	1,396,548	2,307,707
මෝටර් වාහන	10,583,381	13,821,381
දේපළ, පිරියත සහ උපකරණවල මුළු ධාරණ අගය	**870,388,263**	**900,600,030**

13 **අස්පෘශ්‍ය වත්කම්**

13.1	**දළ ධාරණ අගය**	**2020.12.31** දිනට ශේෂය	එකතුකිරීම්	බැහැරකිරීම්	**2020.12.31** දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.
	පරිගණක මෘදුකාංග	177,000	-	-	177,000
	මහපොළ වෙබ් අඩවිය	697,500	77,500	-	775,000
	ක්ෂය කළහැකි වත්කම් වල මුළු වටිනාකම	**874,500**	**77,500**	**-**	**952,000**

13.2	**සමුච්චිත ක්‍රමක්ෂය සහ අපචය වත්කම්**	**2020.01.01.** දිනට ශේෂය	වර්ෂය සඳහා අයකිරීම්	බැහැරකිරීම්	**2020.12.31** දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.
	පරිගණක මෘදුකාංග	34,818	35,400	-	70,218
	මහපොළ වෙබ් අඩවිය	131,473	144,129		275,602
	මුළු ක්ෂයකිරීම්	**166,291**	**179,529**	**-**	**345,820**

13.3	**ශුද්ධ පොත් අගයන්**	**2020**	**2019**
		රු.	රු.
	පරිගණක මෘදුකාංග	106,782	142,182
	මහපොළ වෙබ් අඩවිය	499,398	566,027
	අස්පෘශ්‍ය වත්කම්වල මුළු ධාරණ අගය	**606,180**	**708,209**

14	**ආයෝජන දේපළ**	**2020**	**2019**
		රු.	රු.
	මාලබේ පිහිටි නිදහස් ඉඩම් (ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)වෙත බදු දී තිබේ).	12,460,179	12,460,179
		12,460,179	**12,460,179**

සටහන : මාලබේ පිහිටි මෙම ඉඩම ඇපයෙන් සීමිත ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය වෙත බදු දී තිබේ).

15 පරිපාලිත සමාගම්වල ආයෝජන	**2020**	**2019**
	රු.	**රු.**
නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම*	985,000,000	985,000,000
	985,000,000	**985,000,000**

* නැෂනල් වෙල්ත් කෝපරේෂන් සමාගම (NWCL) මහපොළ භාර අරමුදලෙහි පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් වශයෙන් පිහිටුවන ලදී.

16 වෙනත් ආයෝජන	**2020**	**2019**
	රු.	**රු.**
සංවර්ධන ලොතරැයි මණ්ඩලයේ ප්‍රාග්ධන ආයෝජන	2,200,000	2,200,000
	2,200,000	**2,200,000**

17 මූල්‍ය වත්කම්	**2020**	**2019**
	රු.	**රු.**
ක්‍රමක්ෂය පිරිවැයට අනුව මූල්‍ය වත්කම්		
භාණ්ඩාගාර බැඳුම්කර (උපලේඛනය I බලන්න).	5,772,569,282	6,968,857,143
භාණ්ඩාගාර බැඳුම්කර වාරික සහ වට්ටම්	165,655,344	174,342,511
භාණ්ඩාගාර බිල්පත් (උපලේඛනය II බලන්න).	215,000,000	-
ණයකර (උපලේඛනය II බලන්න)	1,458,750,000	1,738,600,000
ස්ථාවර තැන්පතු (උපලේඛනය II බලන්න)	3,913,071,233	1,863,000,000
ලාභ අලාභ මඟින් සාධාරණ අගයට මූල්‍ය වත්කම්		
නැවත මිලදී ගැනීමේ ගිවිසුම (උපලේඛනය II බලන්න)	300,000,000	-
ලංකා බැංකුව - ස්වයංක්‍රීය අරමුදල් කළමනාකරණ ගිණුම් -4079	2,165,343	2,381,392
	11,827,211,201	**10,747,181,046**

ආයෝජන ප්‍රතිපත්ති සඳහා පිටු අංක 25 සහ 26 හි සඳහන් I සහ II උපලේඛන බලන්න).

18 වෙනත් වත්කම්	**2020**	**2019**
	රු.	**රු.**
විශ්‍රාම ප්‍රතිලාභ වත්කම් (ස්ථාවර තැන්පතු)	3,485,497	3,172,760
ලිපිද්‍රව්‍ය තොගය	198,013	391,597
ජයවර්ධන මධ්‍යස්ථානය සඳහා බදු කුළී තැන්පතුව	1,811,700	1,811,700
සතොස කුළී තැන්පතුව	348,810	348,810
	5,844,020	**5,724,867**

19 අත්තිකාරම් සහ පෙර ගෙවුම්	**2020**	**2019**
	රු.	**රු.**
කාර්ය මණ්ඩල ණය සහ අත්තිකාරම්	775,363	1,259,029
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව	399,000	399,000
වෛද්‍ය රක්ෂණ පෙර ගෙවුම්	23,973	-
උත්සව අත්තිකාරම්	3,750	-
	1,202,085	**1,658,029**

20 ලැබීම්	**2020**	**2019**
	Rs.	**Rs.**
NWCL/NWSLවෙතින් ලැබිය යුතු දෑ - ලැබිය යුතු සක්‍රිය විගණන ගාස්තු	3,769,451	-
-නීති ගාස්තු	1,744,249	-
-ඇවර කිරීමේ ගාස්තු	60,000	-
ව්.වි..ප්‍ර.කොා. වෙතින් ලැබිය යුතු දෑ (භාණ්ඩාගාර දායකත්වය)	129,359,400	214,501,100
සංවර්ධන ලොතරැයි මණ්ඩල මණ්ඩලයෙන් ලැබිය යුතු කොටස්	109,302,245	75,000,000
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී	214,405,331	185,380,223
ලැබිය යුතු භාණ්ඩාගාර බැඳුම්කර කූපන්පත්	203,466,586	229,230,149
ලැබිය යුතු ණයකර පොළී	59,537,942	63,431,406
ලැබිය යුතු පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොළී	77,421	-
ක්ණිකව ලැබෙන ආදායම්	-	24,105
ලැබිය යුතු වාහන රක්ෂණ ගාස්තු	314,186	-
ලැබිය යුතු ශිෂ්‍යත්ව ගෙවීම්	25,000	-
ලැබිය යුතු රක්ෂණ වාරික	5,534	-
	722,067,345	**767,566,984**

21 මුදල් හා මුදල් සමාන දෑ	**2020**	**2019**
	රු.	**රු.**
ලංකා බැංකුව- ජංගම ගිණුම -1791	666,909	866,899
ලංකා බැංකුව- ජංගම ගිණුම -83302834	677,058	145,766
ලංකා බැංකුව- ජංගම ගිණුම -83867162	720,264	47,355
ලංකා බැංකුව - ක්ෂණික ආයෝජන -1791	70,000,000	137,100,000
	72,064,231	**138,160,020**

22 විශ්‍රාම ප්‍රතිලාභ වගකීම්	**2020**	**2019**
	රු.	**රු.**
වර්ෂය ආරම්භයේ දී ශේෂය	3,835,329	3,172,760
පාරිතෝෂික ස්ථාවර තැන්පතු පොළී ආදායම්	269,678	-
වර්ෂය දහා ප්‍රතිපාදන	482,838	662,569
	4,587,845	**3,835,329**

23 උපචිත සහ වෙනත් ගෙවිය යුතු මුදල්	**2020** රු	**2019** රු.
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - විශ්වවිද්‍යාල	260,685,500	441,644,815
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - තාක්ෂණික විද්‍යාල	37,578,500	15,632,400
ගෙවිය යුතු ශිෂ්‍යත්ව - උසස් අධ්‍යාපන ආයතන	1,033,700	326,600
ගෙවිය යතු විවි.ප්‍ර.කොා.ස ප්‍රදාන වියදම්	1,074,258	-
ගෙවිය යුතු විගණන ගාස්තු	649,140	-
ලලින් ඇතුලත්මුදලි අරමුලට දායකත්වය	750,000	-
ගෙවිය යුතු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා ප්‍රදාන	66,150	-
කුවිතාන්සි ආපසු ලැබීම්	2,340,165	-
අතථ්‍ය සත්කාරකත්වය	23,328	23,328
දුරකථන බිල්පත්	24,514	19,728
ගෙවිය යුතු අතිකාල දීමනා	76,689	52,617
ගෙවිය යුතු පැමිණීම් දීමනා	130,000	98,000
පාසල් සංවර්ධන කාර්යයන් සඳහා ලෙවිය යුතු මුදල්	1,074,097	1,074,097
වැටුප් සහ වේතන සඳහා ගෙවිය යුතු මුදල්	161,750	94,000
රැඳවුම් ගිණුම	1,547,409	1,547,409
රැඳවුම් ගිණුම ශාන්ත ආනා විද්‍යාලය	382,417	382,417
රැඳවුම් ගිණුම , ශ්‍රීමත් ජෝන් කොතලාවල විද්‍යාලය	243,502	243,503
ඇඹිලිපිටිය පිහිනුම් තටාකය සඳහා වූවියදම් රැඳවීම	585,449	585,449
ශිෂ්‍යත්ව සඳහා වැඩිපුර ගෙවීම් - කැලණිය වි.වි.	465,900	-
ගෙවිය යුතු රක්ෂණ හිමිකම්	17,235	-
ගෙවිය යුතු භාරකාර ගාස්තු - ලංකා බැංකුව	648,000	-
ආරක්ෂක ගාස්තු - රක්නා ලංකා	42,120	48,000
වාහන කුළී සඳහා වෙන්කිරීම්	143,100	-
විදලි සහ ජල බිල්පත්	244,533	43,482
ගෙවිය යුතු භාෂා පරිවර්තන ගාස්තු	-	40,275
ලිපිද්‍රව්‍ය සහ මුද්‍රණ ගාස්තු	143,971	55,242
ලබා නොගත් නිවාඩු වෙනුවෙන් ගෙවීම්	-	272,261
	310,131,428	**462,183,622**

භාණ්ඩාගාර බැඳුම්කර

ISIN අංකය	කල්පිරීමේ දිනය	කුවිතාන්සි අනුපාතය	ප්‍රකාශිත අගය
LKB010231019	2023.09.01	11.20%	427,343,488
LKB010231019	2023.09.02	11.20%	430,876,247
LKB01025H016	2005.08.01	11.00%	200,000,000
LKB01226F014	2026.06.01	11.00%	250,000,000
LKB01226F014	2026.06.02	11.00%	348,721,408
LKB00521C016	2021.03.01	10.75%	100,000,000
LKB00521C016	2021.03.02	10.75%	50,000,000
LKB00521C016	2021.03.03	10.75%	50,000,000
LKB00523G153	2023.07.15	10.20%	500,000,000
LKB00523G153	2023.07.16	10.20%	200,000,000
LKB00623E156	20203.05.15	11.50%	200,000,000
LKB00821H019	2021.08.01	11.00%	200,000,000
LKB00821H019	2021.08.02	11.00%	50,000,000
LKB00821H019	2021.08.03	11.00%	50,000,000
LKB00824H013	01.08.2024	11.00%	450,000,000
LKB00824H013	2024.08.01	11.00%	50,000,000
LKB00824H013	2024.08.01	11.00%	50,000,000
LKB00824H013	2024.08.01	11.00%	50,000,000
LKB00921E014	2021.05.01	9.00%	2,000,000
LKB00922G017	2022.07.01	11.20%	500,000,000
LKB010231019	2023.09.01	11.20%	350,000,000
LKB01025C157	2025.03.15	10.25%	50,000,000
LKB01025H016	2025.08.01	11.00%	19,643,000
LKB01026H014	202.08.01	11.50%	273,000
LKB00524F153	2024.0.15	10.25%	200,000,000
LKB00827J152	2027.1015	10.30%	100,000,000
LKB01528I017	2028.09.01	11.50%	200,000,000
LKB01028C151	2028.03.15	10.75%	140,000,000
LKB00827J152	2027.10.15	10.30%	100,000,000
LKB00721j157	2021.10.15	9.45%	318,906,063
LKB00623E156	2023.05.15	11.50%	42,900,076
LKB00523C152	2023.03.15	10.00%	30,000,000
LKB00523G153	2023.07.15	10.20%	44,489,000
LKB00322C159	2022.03.15	10.70%	17,417,000
2020.12.31 දිනට භාණ්ඩාගාර බැඳුම්කරයේ ප්‍රකාශිත අගය			**5,772,569,282**

වට්ටම / ප්‍රදානය

2015 -මිලදීගැනීම්	(38,520,371)	
2016 - මිලදීගැනීම්	1,922,495	
2017 -මිලදීගැනීම්	(30,981,167)	
2018 -මිලදීගැනීම්	(35,851,903)	
2019 -මිලදීගැනීම්	(31,916,062)	
2020 -මිලදීගැනීම්	(30,308,335)	165,655,344
2020.12.31 දිනට භාණ්ඩාගාර බැඳුම්කර		**5,938,224,626**

උපලේඛනය II

ස්ථාවර තැන්පතු

බැංකුව	කාලසීමාව	අනුපාතය %	මුදල (රු.)
ලංකා බැංකුව	2020.04.15 - 2021.04.15	8.75%	600,000,000
ජා.ඉ.බැංකුව	2020.0512-20201.05.12	8.80%	1,300,000,000
HDFC බැංකුව	2020.03.0-20201.03.06	10.25%	300,000,000
HDFC බැංකුව	2020.0618-2021.06.18	10.15%	1,400,000,000
මහජන බැංකුව	2020.10.23-2021.10.23	5.75%	200,000,000
ලංකා බැංකුව	2020.04.24-2021.04.24	8.50%	113,071,233
2020.12.31 දිනට ස්ථාවර තැන්පතු			**3,913,071,233**

ණයකර

ආයෝජක	කාලසීමාව	අනුපාතය %	මුදල (රු)
සම්පත් බෑන්ක් පීඑල්සී	2016.06.10-2021.06.10	12.75%	100,000,000
සෙලාන් බැංකුව	2016.07.15-2021.07.15	13.00%	23,680,000
සියපත ෆයිනෑන්ස්	2016.09.20-2021.09.20	13.50%	150,000,000
කොමර්ෂල් බැංකුව	2016.10.28-2021.10.28	12.00%	60,070,000
පීපල්ස් ලීසිං	2016.11.16-2021.11.16	12.60%	50,000,000
එල්බී ෆයිනෑන්ස් පීඑල්සී	2017.12.11-2021.12.11	13.25%	100,000,000
සම්පත් බෑන්ක් පීඑල්සී	2017.12.21-2022.12.21	12.50%	100,000,000
සෙලාන් බැංකුව	2018.09.23-2023.09.23	12.85%	175,000,000
ඩීඑෆ්සීසී බෑන්ක් පීඑල්සී	2018.03.29-2023.03.29	12.60%	200,000,000
ජාතික ඉතිරි කිරීමේ බැංකුව	2019.09.10-2022.09.10	11.00%	500,000,000
2020.12.31 දිනට ණයකර			**1,458,750,000**

භාන්ඩාගාර බිල්පත්

ආයෝජක	කාලසීමාව	ආදායම් අනුපාතය%	මුදල (රු.)
නෙට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ්	2020.12.30-2021.01.08	4.50%	215,000,000
2020.12.31 දිනට භාණ්ඩාගාර බිල්පත්			**215,000,000**

REPO

ආයෝජක	කාලසීමාව	ආදායම් අනුපාතය%	මුදල (රු.)
එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් ලිමිටඩ්	2020.12.-2021.01.08	4.45%	300,000,000
2020.12.31 දිනට ප්‍රති ගැණුම් ගිවිසුම්			**300,000,000**